FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement



# 2020

# ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස

## වාර්ෂික වාර්තාව

### සිදුවීම් සහ ප්‍රවණතා

# ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස

2021 මැයි 03

**ලෝක ජනමාධ්‍ය නිදහස් දිනයට සමගාමීව නිකුත් කෙරිණි**

**නිදහස් මාධ්‍ය ව්‍යාපාරය**

FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

## නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පළ කොට ඇති වෙනත් කෘතීන්

සීතා රංජනී (2011) – **අදහස් ඝාතනයේ ගොදුරු**

නීතිඥ ජගත් ලියනආරච්චි (2016) – **ජනමාධ්‍යවේදීන්ට බලපාන නීති**

නිදහස් මාධ්‍ය ව්‍යාපාරය 25 වන සංවත්සරය වෙනුවෙන් (2017) – **නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට 25 යි**

නිදහස් මාධ්‍ය ව්‍යාපාරය (2017) – **පුළුල් මාධ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරිත්වයකයට ඉදිරි දැක්මක්**

ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන (2019) – **සාමූහික පරිකල්පනයේ පරිවර්තනය උදෙසා මාධ්‍ය භූමිකාව**

නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ ජගත් කම්කරු සංවිධානය (ශ්‍රී ලංකා ශාඛාව) (2019) – **බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම සහ සාධාරණ බඳවා ගැනීම් පිළිබඳ වාර්තාකරණය**

නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය (2019) – **ඩිජිටල් මාධ්‍ය සේවක සමීක්ෂණය**

නිදහස් මාධ්‍ය ව්‍යාපාරය (2020) – **ඩිජිටල් මාධ්‍ය සේවක සමීක්ෂණය**

## ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස වාර්ෂික වාර්තාව - 2020

**© නිදහස් මාධ්‍ය ව්‍යාපාරය- 2021 මැයි**

1 වන මුද්‍රණය කොළඹ

පිටු 36, රූප සටහන් 02, වගු 03

ISBN 978-624-5909-02-5

සියලුම හිමිකම් ඇවිරිණි. ප්‍රකාශයන් ගේ නිසි අවසරයකින් තොරව මෙම වාර්තාව සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් උපුටා දැක්වීම, මුද්‍රිත, ලිඛිත, ඉලෙක්ට්‍රොනික් ආදී කවර මාධ්‍යයකින් හෝ පිටපත් කිරීම විකාශනය කිරීම අනුවර්තනය කිරීම හා ව්‍යාජ ලෙස සැකසූ පිටපත් අලෙවි කිරීම, බෙදා හැරීම සම්පූර්ණයෙන්ම තහනම් වේ.

**පර්යේෂක:** නීතිඥ විරංජන හේරත්
(ආචාර්ය උපාධි අපේක්ෂක දකුණු ආසියානු විශ්ව විද්‍යාලය,
නව දිල්ලිය, ඉන්දියාව)

**පිට කවරය, පිටු සැකසුම හා ඉන්ෆොග්‍රැෆික්:** නලින්ද සෙනෙවිරත්න

**ප්‍රකාශනය**
**නිදහස් මාධ්‍ය ව්‍යාපාරය**
**අංක 96 බර්නාඩ් සොයිසා මාවත,**
**කොළඹ 05**
දුරකතනය: 011 236 8895
විද්‍යුත් තැපැල: fmmsrilanka@gmail.com, fmm.mfrm@gmail.com
අන්තර්ජාලය: www.fmmsrilanla.lk, www.mediareform.lk

# පටුන


මාධ්‍ය නිදහස වාර්ෂික වාර්තාව 2020 ගැන... 6

1. හැඳින්වීම 7
   - 1.1 පර්යේෂණයේ පසුබිම 7
   - 1.2 අරමුණු 8
   - 1.3 ක්‍රමවේදය 8
   - 1.4 විෂය පථය සහ සීමා 8

2. ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස - 2020 වසරට පෙර තත්ත්වය ගැන දළ විශ්ලේෂණයක් 9

3. 2020 දී ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසේ තත්ත්වය 12
   - 3.1 සිතීමේ නිදහස 12
   - 3.2 මත දැරීමේ නිදහස 13
   - 3.3 කතා කිරීමේ නිදහස 13
   - 3.4 අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස 13
   - 3.5 තොරතුරු දැනගැනීමේ නිදහස 13
   - 3.6 පටිගත කිරීමේ නිදහස 14
   - 3.7 පළ කිරීමේ නිදහස 14
   - 3.8 පුවත්පත් නිදහස 14
   - 3.9 විකාශනයේ නිදහස 15
   - 3.10 අන්තර්ජාල නිදහස 15

4. 2020 දී මාධ්‍ය නිදහසට එරෙහි ක්‍රියා සහ වර්ගීකරණය 17

5. වෙනත් සොයා ගැනීම් 22

6. නිගමනය 24

ඇමුණුම 27

# මාධ්‍ය නිදහස වාර්ෂික වාර්තාව 2020 ගැන...

සමාජ වගකීම් සහිත නිදහස් මාධ්‍ය සංස්කෘතියක් වෙනුවෙන් පෙනී සිටිමින් කටයුතු කරන නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පුළුල් ප්‍රජාතන්ත්‍රවාදී දැක්මකින් යුතුව මාධ්‍ය නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සහ මාධ්‍යවේදීන්ගේ අයිතීන් වෙනුවෙන් ප්‍රතිපත්තිමය තලයේදී මෙන්ම ක්‍රියාකාරී වශයෙන්ද මැදිහත් වෙයි. මාධ්‍ය නිදහස උල්ලංඝනය වන සිදුවීම් සම්බන්ධයෙන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විවිධාකාරයෙන් මැදිහත්වීම් කළද වාර්ෂිකව එවැනි විධිමත් තොරතුරු එකතුවක් නොමැතිවීම ක්ෂේත්‍රය තුළ අඩුවක්ව පැවතිණ. රට තුළ සිදු වන මාධ්‍ය නිදහස උල්ලංඝනය සම්බන්ධ තක්සේරුවක් සඳහා එවැනි වාර්තාවක අවශ්‍යතාව බොහෝ අයගෙන් අප වෙත යෝජනා වී තිබිණ. නිදහස් මාධ්‍ය ව්‍යාපාරය කලක සිට ඒ සඳහා උත්සාහ කළ අතර 2020 වසරේ සිදුවීම් ඇසුරෙන් වාර්තාවක් සැකසීමට අවස්ථාව උදා කර ගත හැකි විය. එමෙන්ම 2021 ජනවාරි මස සිට මාසිකව සිදුවීම් සම්බන්ධ නිරීක්ෂණ වාර්තාවක් නිකුත් කිරීම ආරම්භ කිරීමට ද හැකියාව ලැබිණ.

මාධ්‍ය නිදහස සම්බන්ධ දසවැදෑරුම් අයිතීන් සැලකිල්ලට ගනිමින් සකස් කර ඇති මෙම වාර්තාවෙන් 2020 වසරේ ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසේ තත්ත්වය පිළිබඳ දළ චිත්‍රයක් ලබා ගත හැකි වනු ඇත. 2021 වසරේ මැයි මස 03 වෙනිදාට යෙදුන ලෝක ජනමාධ්‍ය නිදහස් දිනය වෙනුවෙන් නිකුත් කිරීමට සැලසුම් කොට කෙටි කලකින් සකස් කළ මෙම වාර්තාව ඒ සඳහා ගත් පළමු උත්සාහය වන බැවින් මෙහිදී 2020 වසරේ ශ්‍රී ලංකාවේ මාධ්‍ය  නිදහස පිළිබඳ තක්සේරුවක් කිරීමට උත්සාහ ගෙන නැත. මාධ්‍ය ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් බහුතරයකගේ සහභාගිත්වයෙන් යුතුව ඉදිරි වාර්තාවලදී එය සිදු කිරීමට සැලසුම් කොට ඇත. එමෙන්ම මෙම වාර්තාව සම්බන්ධයෙන් ඔබ දක්වන අදහස්, යෝජනා අනුව ඉදිරි වාර්තා සංවර්ධනය කර ගැනීමට හැකිවනු ඇති බව අපගේ විශ්වාසයයි. වාර්තාව භාෂා තුනෙන්ම සම්පාදිතය.

නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ උත්සාහය සාර්ථක කර ගැනීමට හැකි වූයේ Open Society Foundation ආයතනයේ සහයෝගය ඒ සඳහා ලැබුණු බැවිනි. එහෙයින් ප්‍රථමයෙන් එම ආයතනයට අපගේ කෘතඥතාව හිමිවේ. කෙටි කලක් තුළ අදාළ පර්යේෂණය කොට වාර්තාව සකස් කිරීමේ කාර්යය ඉටු කළ විරංජන හේරත් මහතාට අපගේ ස්තුතිය හිමි විය යුතුය. වාර්තාවේ කෙටුම්පත් කියවා අදහස් යෝජනාවලින් එය පෝෂණය කිරීමට දායක වූයේ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ විධායක කමිටුවෙන් පත් කළ මාධ්‍ය නිදහස අනුකමිටුව විසිනි. සීතා රංජනී, ලසන්ත ද සිල්වා, සී. දොඩාවත්ත, හනා ඊබ්‍රාහිම්, නිරංජනී රෝලන්ඩ්, ලක්ෂ්මන් ගුණසේකර සහ ආනන්ද ජයසේකර යන අයගෙන් සමන්විත එම අනුකමිටු සාමාජිකයන්ට අපගේ විශේෂ ස්තුතිය හිමි විය යුතුය. අදාල කටයුතු සම්බන්ධීකරණ කටයුතුවලදී දායක වූ කාර්ය මණ්ඩලයේ බර්නාඩ් එදිරිසිංහ මහතාට සහ ඉන්ෆාස් ඉසදීන් මහතාට ද ස්තුතියි.

**සීතා රංජනී**
කැඳවුම්කරු
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය

# 1. හැඳින්වීම



කවියෙකු හා ගුරුවරයෙකු වන අහ්නාෆ් ජසීම් කිසිදු චෝදනාවකින් තොරව රඳවාගෙන ඇත. මානව හිමිකම් සංවිධාන දුහතුනක් අහ්නාෆ් ජසීම් අත් අඩංගුවේ තබා ගෙන සිටීම සම්බන්ධයෙන් සිය දැඩි කනස්සල්ල පළ කර තිබේ. www.theleader.lk

මාධ්‍ය නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය සමග සැලකිය යුතු මට්ටමින් සම්බන්ධ වී පවතියි. පුළුල් මාධ්‍ය නිදහසක් ඇති රටවල සාමාන්‍යයෙන් ඉහළ දේශපාලන ස්ථාවර බවක්, නීතියේ පාලනයක්, ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ දී ආණ්ඩුවේ කාර්යක්ෂමතාවක්, පාලනයේ ගුණාත්මකබවක් සහ දූෂණයේ අවම බවක් පවතියි.[1] යුනෙස්කෝ සංවිධානයට අනුව මාධ්‍ය නිදහස, ප්‍රජාතන්ත්‍රවාදයට, සංවර්ධනයට සහ සංවාදයට තීරණාත්මක පදනමක් වන අතර අනිකුත් සියලුම මානව හිමිකම් ආරක්ෂා කිරීමට සහ වර්ධනය කිරීමට පූර්ව කොන්දේසියකි.[2] එබැවින් රටක මාධ්‍ය නිදහසේ තත්ත්වය මගින් එම රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ මට්ටම පිළිබඳව විචිත්‍රවත් චිත්‍රයක් ලබාදෙයි.

## 1.1 පර්යේෂණයේ පසුබිම

මෙම පසුබිම තුළ "2020 දී ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස පිළිබඳ පර්යේෂණය" මගින් රටේ මාධ්‍ය නිදහසේ තත්ත්වය සහ ප්‍රජාතන්ත්‍රවාදයේ මට්ටම පෙන්නුම් කරයි. මාධ්‍ය නිදහසට එල්ල වූ විවිධ තර්ජන හා අභියෝග සහ වසර තුළ එබඳු ක්‍රියාකාරකම් පිළිබඳ තක්සේරු කිරීමේ ක්‍රියාවලියත් මෙම අධ්‍යයනය මගින් පරීක්ෂාවට ලක් කරයි. කෙසේ වෙතත්, ඓතිහාසික වර්ධනයන්, සාධක සහ සිදුවීම් නිසා, 2020 දී මාධ්‍ය නිදහසේ තත්ත්වය හුදෙකලා කොට විග්‍රහ කළ නොහැකිය. ඒ අනුව, "2020 දී ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස" පර්යේෂණය මගින් උත්සාහ දරන්නේ ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසේ වත්මන් තත්ත්වය සහ එහි ඇගයීම් ක්‍රියාවලියත්, ප්‍රජාතන්ත්‍රවාදයත් පරීක්ෂාවට ලක් කිරීමයි. අනාගත තත්ත්වය පිළිබඳ තක්සේරු කිරීමට අදාළ ඇතැම් මග පෙන්වීම් ද පර්යේෂණයෙන් සැපයෙනු ඇත.

ඕනෑම රටක 'මාධ්‍ය නිදහස' පරීක්ෂාවට ලක් කරන විට අපැහැදිලි යෙදුම් සම්බන්ධයෙන් යම් සම්මුතියක් අවශ්‍ය වෙයි. උදාහරණයක් ලෙස මාධ්‍ය නිදහස යන්නට නිශ්චිත නිර්වචනයක් නැත. බ්‍රිටනිකා විශ්වකෝෂයට අනුව මාධ්‍ය නිදහස යනු, දේශපාලන සහ සිවිල් සමාජයක් තුළ විවිධ මාධ්‍යයන්ට සහ

තොරතුරු මූලාශ්‍රවලට ක්‍රියාත්මක වීමට ඇති නිදහසයි. පුවත්පත් නිදහස යන සාම්ප්‍රදායික අදහස එමගින්, ගුවන්විදුලිය, රූපවාහිනිය, සහ අන්තර්ජාලය වැනි විද්‍යුත් මාධ්‍ය කරා පුළුල් කොට ඇත.[3] යුනෙස්කෝව ප්‍රකාශ කරන්නේ "වචන සහ රූප මගින් අදහස් නිදහසේ ගලායෑම" වර්ධනය කිරීම මාධ්‍ය නිදහසේ පිටකොන්ද බවයි.[4] ඒ අනුව මාධ්‍ය නිදහස, මාධ්‍ය සහ මාධ්‍යවේදියා යන යෙදුම් පිළිබඳව යම් පැහැදිලි කිරීම් පර්යේෂණයේ දී සම්මත කර ගත යුතු වේ.

'මාධ්‍ය නිදහස' යන යෙදුම ගැන පොදුවේ පිළිගත් නිර්වචනයක් නැතත්, මාධ්‍ය නිදහසේ සංරචක ගැන පුළුල් ලෙස පිළිගත් විවිධ සම්මුති පවතී. මාධ්‍ය නිදහසේ පිටකොන්ද වන්නේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසයි. එසේ වුවද, එයට තවත් සංරචක ගණනාවක් ඇතුළත්ය. ඒ තොරතුරු දැනගැනීමේ නිදහස, මත දැරීමේ නිදහස සහ අදහස් සහ මත ප්‍රකාශනය ආදී වශයෙනි.[5] මෙම පර්යේෂණයේ දී මාධ්‍ය නිදහස සංරචක දහයක් එකතුවක් ලෙස සලකනු ලැබ ඇත. ඒ, සිතීමේ නිදහස, මත දැරීමේ නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, කතා කිරීමේ නිදහස, තොරතුරු දැනගැනීමේ නිදහස, පළ කිරීමේ නිදහස, පටිගත කිරීමේ නිදහස (පෙළ, ඡායාරූප, ශබ්ද සහ වීඩියෝ), පුවත්පත් නිදහස, විකාශන නිදහස සහ අන්තර්ජාලය සඳහා නිදහස.[6] එබැවින් මෙහිදී මාධ්‍ය නිදහස යනු මෙම නිදහස් සංරචක දහයේ එකතුවක්ය යන්න මෙම පර්යේෂණයේ සම්මතය ලෙස සලකනු ලැබ ඇත.

ඩිජිටල්කරණය වූ වත්මන් ලෝක තත්ත්වය යටතේ 'මාධ්‍ය' යන යෙදුම ද සංකීර්ණ වෙයි. 2000 වසර දක්වා 'මාධ්‍ය' යන්නට ඇතුළත් වූයේ ප්‍රධාන මාධ්‍ය කර්මාන්ත හතරකි. එනම්, මුද්‍රිත, විකාශන, සංගීත සහ සිනමාවයි. තාක්ෂණයේ වේගවත් සංවර්ධනය (ප්‍රධාන වශයෙන් අන්තර්ජාලයේ වර්ධනය) නිසා සමස්ත කර්මාන්තයේ විශේෂාංගවල කැපී පෙනීමක් සිදු වී තිබේ. සමාජ මාධ්‍ය සහ අන්තර්ජාල මාධ්‍ය වැනි නව වේදිකා බොහොමයක් 'ප්‍රධාන මාධ්‍ය' යෙදුම යටතට පැමිණ තිබේ.[7] එබැවින්, සාම්ප්‍රදායික මාධ්‍ය සහ නව මාධ්‍ය ඇතුළුව සියලුම වර්ගයේ මාධ්‍යයේ නිදහස පිළිබඳව මෙම පර්යේෂණයෙන් පරීක්ෂා කෙරෙයි.

මාධ්‍යවේදියකු හඳුනාගැනීම ද වර්තමානයේ ප්‍රශ්නකාරී තත්ත්වයකි. පෙර කාලයේ, සාම්ප්‍රදායික මාධ්‍යයේ සීමිත විෂය පථය නිසා මාධ්‍යවේදියකු හඳුනාගැනීම පහසු විය. කෙසේවෙතත්, බ්ලොග්කරුවන්, පුරවැසි මාධ්‍යවේදීන් සහ යූ ටියුබ්හි වීඩියෝ නිෂ්පාදකයින් ද මාධ්‍යවේදීන් ලෙස සැලකිය යුතු පසුබිමක් නිර්මාණය වී ඇති අතර ඩිජිටල් සහ සමාජ මාධ්‍යයේ වැඩෙන කාර්යභාරය ද පිළිගත යුතු විය. එබැවින්, මාධ්‍යවේදියකු හඳුනාගැනීමේ දී මාධ්‍යයට සම්බන්ධ වූවන්ගේ ඉලක්ක, උපක්‍රම සහ වටිනාකම් පරීක්ෂා කිරීම ඔවුන්ගේ ආයතනික සම්බන්ධතාවලට එහා ගිය වැදගත්කමකින් යුත් කාර්යයක් විය.[8] එබැවින් මෙම අධ්‍යයනය මගින් මාධ්‍යවේදියකු හඳුනාගනු ලබන්නේ, පුවත්පත්, ගුවන්විදුලි, සහ රූපවාහිනී ආදියේ සම්ප්‍රදායික මාධ්‍ය ක්‍රියාකාරීන් සහ බ්ලොග්කරුවන්, පුරවැසි මාධ්‍යවේදීන් සහ සයිබර් ක්‍රියාකාරීන් ආදී සියල්ලන් වශයෙනි.

එමෙන්ම, ආණ්ඩුවෙන් හෝ පෞද්ගලික පාර්ශ්වයන් යන කුමන අංශයකින් හෝ මාධ්‍ය නිදහසට එල්ල වන අභියෝග පර්යේෂණයට ඇතුළත් කළ බව සටහන් කිරීම වැදගත් වෙයි. මාධ්‍ය නිදහස සහ මාධ්‍ය අයිතීන් උල්ලංඝනය රජයෙන් හෝ ආණ්ඩුවෙන් පමණක් සිදු නොවන අතර විශාල සමාගම්, සිවිල් කණ්ඩායම්, වාර්ගික ආගමික අන්තවාදීන් ඇතුළු ඇතැම් සිවිල් සහ පෞද්ගලික පාර්ශ්ව මාධ්‍ය නිදහසට එරෙහිව ක්‍රියාකාරීව සිටිති. එබැවින්, ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසට එරෙහිව ඕනෑම පාර්ශ්වයකින් සිදු කරන තර්ජන මෙහි දී පරීක්ෂාවට ලක් කරනු ලැබ ඇත.

## 1.2 අරමුණු

- 2020 දී ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසේ තත්ත්වය පරීක්ෂා කිරීම.
- ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ මාධ්‍ය නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය අතර සම්බන්ධය හඳුනා ගැනීම.
- රටේ මාධ්‍ය නිදහසට එරෙහි ක්‍රියා සහ ස්වරූප සහ මානයන් සොයාගැනීම සහ ඒවායේ බලපෑම තක්සේරු කිරීම.
- ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස් අයිතීන් උල්ලංඝනයන් හඳුනාගැනීමට යොදා ගන්නා දර්ශක ඇගයීම.
- මාධ්‍ය නිදහසට එරෙහි සියලු ක්‍රියාකාරකම් සොයා ගැනීමට සහ ආවරණය කිරීමට උචිත සහ ප්‍රයෝජනවත් දර්ශක හඳුනා ගැනීම.

## 1.3 ක්‍රමවේදය

පර්යේෂණයේ දී අනුගමනය කරන ලද්දේ න්‍යායික සහ ආනුභාවික භාවිතයන් දෙකම ඇතුළත් මිශ්‍ර ක්‍රමවේදයකි. න්‍යායික අංශයට ලේඛන, වාර්තා සහ ලිපි සමාලෝචනය ඇතුළත් විය. සම්මුඛ සාකච්ඡා සහ සහභාගීත්ව නිරීක්ෂණය ආනුභවික ශිල්ප ක්‍රමයට ඇතුළත් විය. සාමාන්‍ය ක්‍රම සහ මයික්‍රොසොෆ්ට් මෘදුකාංග මෙවලම් ද, විශ්ලේෂණය සඳහා යොදාගනු ලැබීය.

## 1.4 විෂය පථය සහ සීමා

පර්යේෂණය කෙටි කාලයකින් ක්‍රියාත්මක කරනු ලැබීය. (මාස තුනක් ඇතුළත). කොවිඩ් 19 වසංගතය නිසා ගමන් බිමන්වලට සීමා පැනවීම මගින් පර්යේෂණයේ ආනුභාවික කටයුතු කරගෙන යෑමට ප්‍රශ්න ගණනාවක් ඇති කළේය. කෙසේ වෙතත්, අතථ්‍ය (virtual) ඉඩ කඩ මෙම හිඩැස පියවීමට තරමක් දුරට ආධාර විය.

# 2. ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස - 2020 වසරට පෙර තත්ත්වය ගැන දළ විශ්ලේෂණයක්




මැයි 31 දින දමිළ මාධ්‍ය සංසදයේ 16 වන වාර්ෂික සැමරුම සඳහා යාපනය මාධ්‍ය සංගමයේ පැවති උත්සවයකට මාධ්‍යවේදීන් හත් දෙනෙකු සහභාගී වෙමින් සිටියදී, උප සභාපති සහ මාධ්‍යවේදී නදීසන් පහන් දැල් වූ අවස්ථාව. මෙම අවස්ථාවේ ආරක්ෂක අංශ සාමාජිකයින් 14 දෙනෙකු එම ස්ථානයට පැමිණ සිටියහ. www.theleader.lk

මාධ්‍ය නිදහස තහවුරු කිරීමට අදාළ වන ජාත්‍යන්තර මානව හිමිකම් යාන්ත්‍රණ රැසකි. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය, ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය ආදිය ඒ අතරින් කැපී පෙනේ. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මෙහිදී අතිශය වැදගත් වන අතර එහි 19 වන වගන්තිය දක්වන ආකාරයට සෑම පුද්ගලයෙකුටම අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ඇති අතර ඊට දේශසීමාවන්ගෙන් තොරව තොරතුරු, සෑම අන්දමකම අදහස් වාචිකව, ලිඛිතව, හෝ මුද්‍රිතව ද චිත්‍රවල ආකාරයෙන් ද එසේ නොමැතිව තමාට කැමති වෙනත් ඕනෑම මාධ්‍යයකින් ද සොයා ගැනීමට, ලැබීමට, දැන්වීමට තිබෙන නිදහස ඇතුළත් වේ. මාධ්‍ය නිදහසට අදාළ මූලික අංග ගණනාවක් ඇතුළත් මෙම සම්මුතිය ශ්‍රී ලංකාව විසින්ද අපරානුමත කර තිබේ.

ලෝකයේ සෙසු බොහෝ රටවල් මෙන්ම ශ්‍රී ලංකාවද මාධ්‍ය නිදහසට අදාළ මෙම මෙම අන්තර්ජාතික ප්‍රවේශයන් සිය රට තුළ විවිධාකාරයෙන් පිළිගැනීමට ලක් කර තිබේ. උදාහරණයක් ලෙස, කතා කිරීමේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින් පිළිගනු ලැබූ මූලික අයිතියකි.[9] ඊට අමතරව, ආණ්ඩුව තොරතුරු දැනගැනීමේ අයිතිය පනතකින් නීතිගත කොට ඇත.[10] ඒ හැරුණු විට, මාධ්‍ය නිදහස පිළිබඳ සිද්ධාන්ත ශක්තිමත් කරන කැපී පෙනෙන නඩු තීන්දු ශ්‍රී ලංකාවේ උපරිමාධිකරණ විසින් ලබා දී තිබේ.[11]

කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසට සම්බන්ධ ප්‍රශ්න සැලකිය යුතු මට්ටමකින් වාර්තා වෙමින්

පවතියි. උදාහරණයක් ලෙස, 1981 සිට 2009 දක්වා වූ කාලය තුළ මාධ්‍ය ක්‍රියාකාරීන්, මාධ්‍ය සේවකයන්, කලාකරුවන් සහ සංස්කෘතික කාර්යධරයන් 116 දෙනෙකු ඝාතනය කරනු ලැබ ඇත.[12] එමෙන්ම 2010-2014 කාලයේ දී, මාධ්‍යවේදීන් සහ මාධ්‍ය සේවකයින් 40 දෙනෙකු ඝාතනය කරනු හෝ අතුරුදන් කරනු ලැබ ඇත.[13] ඒ හැරුණු විට, මාධ්‍යවේදීන්ට එරෙහිව පමණක් නොව මාධ්‍ය ආයතනවලට එරෙහිව ද, පැහැරගෙන යැම්, ප්‍රහාර සහ බියවැද්දීම් සිදුව ඇත.[14] එමෙන්ම, මාධ්‍යවේදීන්ට එරෙහි අපරාධ සඳහා දණ්ඩ මුක්තිය ක්‍රියාත්මක වීම, මාධ්‍ය මර්දනය යුක්තිසහගත කිරීම සහ අන්තර්ජාලය වසා දැමීම ආදී සියල්ල මාධ්‍ය නිදහස පිළිබඳ සිද්ධාන්තය සම්බන්ධයෙන් තීරණාත්මක ගැටලු බවට පත්ව ඇත. 2000 සිට 2019 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස සම්බන්ධයෙන් සිදුකරන ලද අධ්‍යයන සහ විශ්ලේෂණයන්හිදී මාධ්‍ය නිදහසට එරෙහි සිදුවීම් පහත සඳහන් කාණ්ඩ 13 ක් යටතේ හඳුනාගනු ලැබ ඇත.

### 01 වගුව - මාධ්‍ය නිදහස සම්බන්ධ ප්‍රශ්න - 2000-2019 අතර සිදුවීම් සාරාංශය

| කාණ්ඩ | උදාහරණ |
|---|---|
| ඝාතන සහ අතුරුදන් කිරීම් | එම් නිමලරාජන් - ඝාතනය කළා - 19/10 /2000,<br>ධර්මරත්නම් සිවරාම් - ඝාතනය කළා - 28/04/2005,<br>රේලන්ගී සෙල්වරාජා - ඝාතනය කළා - 12/08/2005,<br>ලසන්ත වික්‍රමතුංග - ඝාතනය කළා - 08/01/2009,<br>එස් රාමචන්ද්‍රන් - අතුරුදන් කරන ලැබුවා - 15/02/2007,<br>ප්‍රගීත් එක්නැලිගොඩ - අතුරුදන් කරනු ලැබුවා- 24/10/2010 |
| පහරදීම් සහ පැහැරගෙන යැම් | කීත් නොයාර් - පැහැරගෙන ගොස් පහර දුන්නා -22/05/2008,<br>උපාලි තෙන්නකෝන් - පහර දුන්නා - 23/01/2009,<br>එන්. විද්‍යාදරන් - පැහැරගෙන ගොස් පහර දුන්නා - 26/02/2009,<br>පෝද්දල ජයන්ත - පැහැරගෙන ගොස් පහර දුන්නා - 01/06/2009 |
| තර්ජන | මන්දනා ඉස්මයිල් - 23/08/ 2011,<br>කේ. ප්‍රසන්න - 12/08/2019 |
| බාධා කිරීම් සහ තර්ජනය කිරීම් | එම් එන් අමීනුල්ලා - බාධා කළා - 21/07/1209,<br>පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ කටයුතු සජීවී විකාශය තහනම් කිරීම - බාධා කළා -04/06/2019 |
| මාධ්‍ය ආයතනවලට ප්‍රහාර | සුදොරෝලි පුවත්පත් කාර්යාලය - බෝම්බ ප්‍රහාරයක් -29/08/2005,<br>සිරස මැදිරි සංකීර්ණය - පහර දුන්නා - 30/07/2010,<br>සියත මාධ්‍ය ආයතනය - පහර දුන්නා -30/07/2010,<br>ලංකා ඊ නිව්ස් - ගිනි තැබුවා - 01/02/2011,<br>උදයන් පුවත්පත් කාර්යාලය - පහර දුන්නා - 13/04/2013 |
| සමාජමාධ්‍ය සහ වෙබ් අඩවි අවහිර කිරීම | පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව සමාජ මාධ්‍යයට පිවිසීම සීමා කරනු ලැබීය. 2017 නොවැම්බර් 10 දා ලංකා ඊ නිව්ස් වෙබ් අඩවිය අවහිර කිරීම. |
| අන්තර්ජාලය වසා දැමීම | 2018 මාර්තු 07 දා රටේ ඇතැම් ප්‍රදේශවල අන්තර්ජාලය වසා දැමීය. |
| නීතිමය ප්‍රශ්න (මාධ්‍ය අයිතීන්ට නරක ලෙස බල පෑ හැකි ලෙස නව නීති හඳුන්වා දීම හෝ පවතින නීති සංශෝධනයට උත්සහ දැරීම) | 1980 අංක 30 දරන ස්වේච්ඡා සමාජ සේවා පනත සංශෝධනයට 2018 මාර්තු මාසයේ ආණ්ඩුව දැරූ උත්සාහය |
| විධායක තීරණ (ජනාධිපති සහ ඇමතිවරුන් ඇතුළු විධායකය මාධ්‍ය නිදහසට එරෙහිව ගත් තීරණ) | ආරක්ෂක අමාත්‍යාංශය මගින් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ පාලනය ගැනීමට 2019 සැප්තැම්බරයේ දී ජනාධිපති උත්සාහ දැරීය. |

| කාණ්ඩ | උදාහරණ |
|---|---|
| පොලිසියේ විෂමාචාරය | නීතිය අයථා ලෙස යොදා ගනිමින් නිදහස් මාධ්‍යවේදී කුසල් පෙරේරාට එරෙහිව පියවර ගැනීමට 2019 ජුනි මාසයේ පොලීසිය උත්සාහ දැරීය. |
| දණ්ඩ මුක්තිය (මාධ්‍යවේදීන්ට එරෙහි අපරාධ සම්බන්ධයෙන් යුක්තිය ප්‍රමාද කිරීම) | මාධ්‍යවේදීන්ට එරෙහි ප්‍රධාන අපරාධ 30 ක් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් හඳුනාගනු ලැබ ඇත. (2000-2015) කෙසේ වෙතත්, කිසිදු යුක්තිය ඉටුවීමක් නැත.[15] |
| මාධ්‍ය සේවක අයිතීන් (මාධ්‍යවේදීන් ඇතුළුව මාධ්‍ය සේවකයින්ගේ සියලු වෘත්තීය සහ කම්කරු අයිතීන් උල්ලංඝනය කිරීම්) | ස්වර්ණවාහිනී රූපවාහිනී ආයතනයේ පරිපාලනය වෘත්තීය සමිතියක් පිහිටුවීම මත පදනම්ව මාධ්‍ය සේවකයින් 15 දෙනකු සේවයෙන් නෙරපීමට 2018 අගෝස්තු මාසයේ කටයුතු කළේය. |
| වාරණය (නීතියෙන් හෝ පෞද්ගලික කණ්ඩායම් විසින් ක්‍රියාත්මක කරන) | කේ. කේ. ශ්‍රීනාත් චතුරංග විසින් රචනා කළ "බුදුන්ගේ රස්තියාදුව" නම් කෘතිය, 2018 අගෝස්තු මාසයේ දී බෞද්ධ අන්තවාදී කණ්ඩායම්වල දැඩි විරෝධයට ලක් විය. |

**උදාහරණයක් ලෙස, 1981 සිට 2009 දක්වා වූ කාලය තුළ මාධ්‍ය ක්‍රියාකාරීන්, මාධ්‍ය 'වෘත්තිකයන්, කලාකරුවන් සහ සංස්කෘතික කාර්යධරයන් 116 දෙනෙකු ඝාතනය කරනු ලැබ ඇත. එමෙන්ම 2010-2014 කාලයේ දී, මාධ්‍යවේදීන් සහ මාධ්‍ය 'වෘත්තිකයින් 40 දෙනෙකු ඝාතනය කරනු හෝ අතුරුදන් කරනු ලැබ ඇත. ඒ හැරුණු විට, මාධ්‍යවේදීන්ට එරෙහිව පමණක් නොව මාධ්‍ය ආයතනවලට එරෙහිව ද, පැහැරගෙන යෑම්, ප්‍රහාර සහ බියවැද්දීම් සිදුව ඇත. එමෙන්ම, මාධ්‍යවේදීන්ට එරෙහි අපරාධ සඳහා දණ්ඩ මුක්තිය ක්‍රියාත්මක වීම, මාධ්‍ය මර්දනය යුක්තිසහගත කිරීම සහ අන්තර්ජාලය වසා දැමීම ආදී සියල්ල මාධ්‍ය නිදහස පිළිබඳ සිද්ධාන්තය සම්බන්ධයෙන් තීරණාත්මක ගැටලු බවට පත්ව ඇත.**

මෙම ප්‍රශ්න හේතුවෙන් වසර ගණනාවක් තිස්සේ මාධ්‍ය නිදහස් දර්ශකවලින් ශ්‍රී ලංකාවට හිමි වූයේ ඉතා පහළ ස්ථානයකි. ෆ්‍රීඩම් හවුස් ආයතනය ඔවුන්ගේ මාධ්‍ය නිදහස් තත්ත්වය නිර්ණයේ දී ශ්‍රී ලංකාව "නිදහස් නොවන කලාපයේ"[16] තබා ඇති අතර ආර්. එස්. එෆ්. ආයතනය ඔවුන්ගේ මාධ්‍ය නිදහස් දර්ශකයේ දී 2013 සිට මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකාව තබා ඇත්තේ රටවල් 180ක් අතරින් 126ට ඉහළ ස්ථානයකය.[17]

රට තුළ මාධ්‍ය නිදහස ශක්තිමත් තත්ත්වයක නොතිබුණද, වෙනස් ධාරාවන් ඔස්සේ විවිධ ධාරිතාවන් යටතේ 10,000ක් පමණ දෙනා මාධ්‍යවේදී වෘත්තියේ යෙදී සිටිති.[18] 2019 වසර අවසානයට ආසන්න කාලයේ වාර්තා පෙන්නුම් කරන්නේ, පුවත්පත් 35ක්, රූපවාහිනී නාලිකා 24ක් සහ ගුවන් විදුලි මධ්‍යස්ථාන 58ක් ලියාපදිංචිව තිබූ බවයි.[19] එමෙන්ම, ප්‍රවෘත්ති අඩවි, මුහුණුපොතේ පිටු, යූ ටියුබ් නාලිකා සහ සාම්ප්‍රදායික මාධ්‍ය ආයතනවල වෙබ් අනුවාද වැනි ඩිජිටල් මාධ්‍ය වේදිකා සැලකිය යුතු මාධ්‍ය ප්‍රවර්ගයක් බවට පත්ව ඇත. එක් පර්යේෂණයකින් පෙන්වා දී ඇත්තේ තරුණ මාධ්‍යකරුවන් බොහෝ දෙනකු ඩිජිටල් මාධ්‍ය වේදිකාවල සැලකිය යුතු අයුරින් ක්‍රියාත්මක ව සිටින බවයි.[20]

මාධ්‍ය නිදහස, මාධ්‍ය අයිතීන් සහ එබඳු තේමා ඔස්සේ ක්‍රියාත්මක වන මාධ්‍ය සංවිධාන ගණනාවක් ශ්‍රී ලංකාවේ ඇත. නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය, ශ්‍රී ලංකාවේ මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය යන ප්‍රධාන සංවිධාන, මාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනයට අනුබද්ධව ශ්‍රී ලංකාවේ සිට ක්‍රියාත්මක වෙයි. ඒවාට අමතරව තරුණ මාධ්‍යවේදීන්ගේ සංගමය, දෙමළ මාධ්‍ය සන්ධානය, මුස්ලිම් මාධ්‍ය සංසදය, සහ දකුණු ආසියානු නිදහස් මාධ්‍ය කාන්තාවෝ ආදිය ද විවිධ මට්ටම්වලින් සහ තරුණයින් දෙමළ, මුස්ලිම්, සහ කාන්තා යන විශේෂතා යටතේ මාධ්‍ය අයිතීන් වෙනුවෙන් ක්‍රියාත්මක වෙයි. ඩිජිටල් මාධ්‍යයේ වර්ධනයත් සමග අන්තර්ජාල මාධ්‍ය ක්‍රියාකාරීත්වය, වෘත්තීය වෙබ් මාධ්‍යවේදී සංගමය වැනි ඇතැම් නව වේදිකා බිහි වී ඇත. ඊට අමතරව යාපනයේ පුවත්පත් සමාජය, වවුනියාව පුවත්පත් සමාජය, මඩකලපුව පුවත්පත් සමාජය සහ මාතර මාධ්‍යවේදීහු යනාදී වශයෙන් දිස්ත්‍රික්ක වශයෙන් ක්‍රියාත්මක මාධ්‍ය සංගම්ද, ප්‍රාදේශීය පදනමෙන් ක්‍රියාත්මක වන තවත් මාධ්‍යවේදී සංවිධාන රැසක් ද පවතී.

# 3. 2020 දී ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසේ තත්ත්වය



පොලිස් පරීක්ෂක නියෝමාල් රංගජීව විසින් කරන ලද බිය ගැන්වීම් සහ තර්ජන, වෘත්තිකයන්ගේ කටයුතු කඩාකප්පල් කිරීම ඡායාරූප ශිල්පී අකිල ජයවර්ධන කොළඹ මහාධිකරණ පරිශ්‍රයේදී, srilankatwo.wordpress.com

ඉහතින් සඳහන් කළ පරිදි මාධ්‍ය නිදහසට සංරචක දහයක් ඇතුළත් වන අකාරයට මෙම පර්යේෂණයට පදනම සකසා ගෙන තිබේ. වඩාත් නිශ්චිතව කිවහොත්, මාධ්‍යවේදීන්ට සහ මාධ්‍ය නිදහස භුක්ති විඳින්නන්ට තිබිය යුතු නිදහස් සංරචක දහයක් මෙහිදී අදාළ කරගෙන තිබේ. ඉන් එක් නිදහසක් උල්ලංඝනය වීම මාධ්‍ය නිදහසේ අනෙක් සංරචකයන්ටද අයහපත් ලෙස බල පෑ හැකිය. මෙම නිදහස් සංරචක දහය එකිනෙක බැඳී ඇති අතර එකිනෙකට සම්බන්ධය. විශේෂයෙන් මෙහි පළමුව සඳහන් නිදහස් සංරචක හතර වන සිතීමේ, මත දැරීමේ, කතා කිරීමේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස මාධ්‍ය නිදහස ක්‍රියාත්මක වීමට අදාළ පදනම සකසයි. තොරතුරු දැනගැනීම, පටිගත කිරීම සහ පළ කිරීම සඳහා වන නිදහස මාධ්‍ය නිදහසට අදාළ පහසුකම් සැපයීම සිදු කරයි. මාධ්‍ය නිදහස ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී පළ කිරීමේ, පුවත්පත්, විකාශන, සහ අන්තර්ජාල නිදහස වැදගත් වෙයි.

මේ පසුබිම තුළ මාධ්‍ය නිදහසට අදාළ සංරචකයන් එකිනෙකට වෙනස් කොටස් ලෙස වෙනමම හඳුනාගෙන විශ්ලේෂණය කිරීම පහසු නැත. කෙසේ වෙතත්, 2020 වර්ෂයේ ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස සම්බන්ධයෙන් නිවැරදි සහ පැහැදිලි පින්තූරයක් හඳුනාගැනීම සඳහා අදාළ වසර තුළ සිදු වූ සිදුවීම් මෙම සංරචකයන් සමග සමපාත කරමින් තේරුම් ගැනීම අවශ්‍ය වෙයි. මෙහි දී ඇතැම් සිදුවීම් සංරචකයන් කිහිපයක් තුළට ගොනු කළ හැකි අවස්ථා පවතින බවද සඳහන් කළ යුතු වේ.

## 3.1 සිතීමේ නිදහස

සාමාන්‍ය අවබෝධය අනුව 'සිතීමේ නිදහස' යන්නෙන් අදහස් වන්නේ ස්වාධීනව කරුණු වටහා ගැනීමට, මතවාදයකට හෝ චින්තනයකට ඇති නිදහසයි. එය සියලු මානව හිමිකම්වල සම්භවය ලෙස සලකනු ලබයි. එමෙන්ම, අන්තර්ජාතික, කලාපීය සහ දේශීය මානව හිමිකම් යාන්ත්‍රණ ගණනාවක් මගින් එය නිරපේක්ෂ සහ මූලික මානව හිමිකමක් ලෙස පිළිගෙන ඇත.[21] ශ්‍රී ලංකාව ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මෙම අයිතිය මූලික අයිතියක් ලෙස පිළිගෙන ඇත.[22]

2020 දී, සුළුතර ප්‍රජාවකට අයත් මාධ්‍යවේදියකු

සංවිධානාත්මකව වෛරී ප්‍රකාශවලට ලක්කිරීමේ අවස්ථාවක් නිරීක්ෂණය කිරීමට හැකි විය.[23] එමෙන්ම, සුළුතර ප්‍රජාවකගේ සාමාජිකයකු වීම පදනම් කරගෙන රටේ ඇතැම් මාධ්‍යවේදීන්ට එරෙහිව අසාධාරණයන් සිදු වූ තවත් අවස්ථා ගණනාවක් පර්යේෂක විසින් නිරීක්ෂණය කොට ඇත. විශේෂයෙන් දෙමළ සහ මුස්ලිම් මාධ්‍යවේදීන්ගේ වාර්තාකරණයන් පිළිබඳ අසත්‍ය සහ අසාධාරණ චෝදනා එල්ල කරමින් කටයුතු කරන ආකාරය නිරීක්ෂණය කිරීමට හැකි විය. මෙම වෛරී ක්‍රියා ප්‍රධාන වශයෙන් සංවිධානය කරන ලද්දේ අන්තවාදී කණ්ඩායම් විසින් වන අතර එබඳු ක්‍රියා වැළැක්වීමට බලධාරීන් කිසිදු අර්ථවත් පියවර ගැනීමක් සිදු කළේ නැත. සුළුතර ප්‍රජාවකගේ සාමාජිකයකු වීම පදනම් කරගෙන මාධ්‍යවේදියකු වෛරී ප්‍රකාශ වලට හෝ වෙනස් කොට සැලකීමකට බඳුන් කිරීම පැහැදිලිවම සිතීමේ නිදහස උල්ලංඝනය කිරීමක් බව සටහන් කිරීම වැදගත් වෙයි. එමගින් ඔවුන්ගේ සිතීමේ නිදහසට අයහපත් බලපෑමක් ද සිදු වන අතර ඒ හරහා සමස්ත මාධ්‍ය නිදහසම තර්ජනයකට ලක් වෙයි.

## 3.2 මත දැරීමේ නිදහස

සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට අනුව කිසිදු බලපෑමකින් තොරව මත දැරීමේ අයිතිය සියලු දෙනා සතු විය යුතුය.[24] එහි අදහස නම්, ආණ්ඩුව, සමාජ කණ්ඩායම් හෝ මාධ්‍ය හිමිකරුවන් ඇතුළුව කිසිදු පාර්ශ්වයක බලපෑමෙන් තොරව තමන්ගේම මත දැරීමේ අයිතිය මාධ්‍යවේදීන් ඇතුළු සියලු දෙනා සතු විය යුතු බවයි. ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ මෙම අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 සහ 14 වගන්ති මගින් තහවුරු කොට ඇත.[25]

ජනමාධ්‍යවේදීන්ගේ මත දැරීමේ නිදහස 2020 වසරේ සිදුවීම් ගණනාවක් මගින් උල්ලංඝනය විය. උදාහරණයක් ලෙස, රජයට අයත් ලේක්හවුස් පුවත්පත්හි ඇතැම් මාධ්‍යවේදීන් සහ මාධ්‍ය සේවකයින් අසාධාරණයට ලක් වූයේ සහ පදනම් විරහිත පොලිස් පැමිණිලිවලට ගොදුරු වූයේ ඔවුන්ගේ වෙනස් දේශපාලන මත හේතුවෙනි.[26] එමෙන්ම, ආණ්ඩුවට අයත් මාධ්‍ය ආයතනවල මාධ්‍යවේදීන් ගණනාවක්, ඔවුන් වෙනස් දේශපාලන මත දැරීම නිසා අදාළ නැති ඒකක වෙත මාරු කර යවා ඇති බව පර්යේෂකට සොයාගත හැකි විය.[27] එබඳු ක්‍රියා සැලකිය යුතු වන්නේ මත දැරීමේ නිදහස මත පදනම් වූ "මාධ්‍ය නිදහසට එරෙහි ක්‍රියා" වශයෙනි.

## 3.3 කතා කිරීමේ නිදහස

කතා කිරීමේ නිදහස සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස බොහෝ අවස්ථාවල එකට ගෙන විස්තර කළ ද, එම අයිතීන් අතර සුළු වෙනස්කම් ඇත. කතා කිරීමේ නිදහස යනු ඕනෑම ආකාරයක කතා කිරීමේ (වාචිකව හෝ ලිඛිතව) නිදහස වේ. හොඳ තර්කනයකින්, තාර්කික සහ හේතුවාදී බවකින් යුක්තව විරුද්ධ මත පළ කිරීමට පුලුල් නිදහසක් පැවතීම මෙහිදී අත්‍යවශ්‍යය වේ ය. යුක්ති සහගත සීමා කිරීම්වලට යටත්ව මෙම අයිතිය, ශ්‍රී ලංකාව ඇතුළු[28] ජාත්‍යන්තර, කලාපීය සහ දේශීය යාන්ත්‍රණ ගණනාවක් මගින් පිළිගෙන ඇත.

මාධ්‍ය නිදහස සම්බන්ධයෙන් ගත් කල, බ්ලොග්කරුවන් සහ පුරවැසි මාධ්‍යවේදීන් ඇතුළුව සියලු මාධ්‍යවේදීන්ට මෙම අයිතිය තිබිය යුතුය. සමාජ මධ්‍යයේ ඔවුන්ගේ කතා පිළිබඳව ඇතැම් පුරවැසි මාධ්‍යවේදීන් අත් අඩංගුවට ගත් බව හෝ පොලිස් පරීක්ෂණවලට ලක් වූ බව 2020 දී වාර්තා විය.[29] කොවිඩ් වසංගතය හමුවේ රජයේ කටයුතු සම්බන්ධයෙන් සමාජ මාධ්‍යවල විවේචනාත්මකව අදහස් පළ කළ පිරිසද මේ අතර විය.[30] එසේ වුවද, ඇතැම් අත් අඩංගුවට ගැනීම් සිදු වුයේ සමාජය කැලඹීමට පත්විය හැකි තහවුරු නොකළ අසත්‍ය තොරතුරු ප්‍රචාරය නිසා බව සටහන් කළ යුතුය.[31] කෙසේවෙතත්, අසත්‍ය පුවත් පළ කිරීම සම්බන්ධයෙන් සිදු කරන පරීක්ෂණ සහ අත්අඩංගුවට ගැනීම් සාධාරණ සීමා කිරීම්වලට අනුකූල විය යුතු අතර ඒවා ක්‍රියාත්මක කිරීම නීත්‍යානුකූලභාවයේ සහ අවශ්‍යතාවයේ පරීක්ෂාවෙන් සමත් විය යුතුය. කෙසේ වෙතත්, එබඳු ක්‍රියා පිළිබඳ නිගමන දීමට තවමත් කල් වැඩිය. එසේ වුවද, අත් අඩංගුවට ගැනීම සහ රඳවා තබා ගැනීම මගින්, ඇතැම් සිදුවීම්වල දී බලධාරීන් සීමා ඉක්මවා ගොස් ඇති බව නිරීක්ෂණය කොට තිබේ. අසත්‍ය පළ කිරීම් හේතුවෙන් චෝදනා එල්ල කොට අත්අඩංගුවට ගන්නා පුද්ගලයන් නිසි ලෙස චෝදනා ඉදිරිපත් නොකර රක්ෂිත බන්ධනාගාර ගතකොට රඳවා තබාගැනීම පිළිබඳ වාර්තා වන අතර එවැනි තත්වයන් එම පුද්ගලයන්ගේ කතා කිරීමේ නිදහස පමණක් නොව තවත් මානව හිමිකම් රැසක්ද උල්ලංඝනය කිරීමක් වෙයි.

එයට අමතරව, තමන්ගේ වෘත්තීය සහ කම්කරු අයිතීන් ඉල්ලා සිටීම නිසා, ඇතැම් පෞද්ගලික රූපවාහිනී සහ ගුවන්විදුලි මධ්‍යස්ථානවල මාධ්‍යවේදීන්ගේ වැඩ තහනම් කළ සහ සේවයෙන් ඉවත් කළ සිදුවීම් ගණනාවක් ඇත.[32] එබඳු ක්‍රියාවන් ද, සිය අයිතිවාසිකම් දිනාගැනීම සඳහා හඬ නැගීම හෙවත් කතා කිරීමේ නිදහස මත පදනම්ව මාධ්‍ය නිදහස උල්ලංඝනය කිරීම්වලට ඇතුළත් කළ හැකිය.

## 3.4 අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස

සාමාන්‍යයෙන්, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස එහි පුළුල් තේරුම නිසා මාධ්‍ය නිදහස සමස්තයක් ලෙස ආවරණය වන යෙදුමක් ලෙස භාවිතා කරනු ලබයි. එබැවින්, එයට කතා කිරීම සහ චිත්‍ර, ප්‍රබන්ධ, කාටූන්, සිනමා, නාට්‍ය, පෙත්සම් සහ සංවිධානය වීම වැනි අදහස් ප්‍රකාශ කිරීම් ද ඇතුළත්ය.[33] මෙම අයිතිය ලොව පුරා පුළුල් ලෙස පිළිගැනීමට ලක් කර ඇති අතර ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වැනි වගන්තියෙන් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස තහවුරු කොට ඇත.

මෙම අයිතිය මාධ්‍ය නිදහසේ "කොඳු නාරටිය"

ලෙස සලකනු ලැබුවද, මාධ්‍යවේදීන්ට එරෙහිව මීට අදාළ උල්ලංඝනය කිරීම් ගණනාවක් 2020 දී ශ්‍රී ලංකාවෙන් වාර්තා විය. උදාහරණයක් ලෙස කොවිඩ් සහන බෙදාහැරීමේ අසමානතා සම්බන්ධයෙන් වාර්තා කිරීම මත මාධ්‍යවේදීන් කණ්ඩායමක් වෛරී ප්‍රචාරයකට ලක් විය.[34] එමෙන්ම, ඔවුන්ගේ වාර්තාකරණය නිසා මාධ්‍යවේදීන් ගණනාවකගේම නිවෙස්වලට සහ කාර්යාලවලට පහර දෙනු ලැබීය. මෙබඳු උල්ලංඝනයන් 2020 දී ප්‍රවණතාවක් ලෙස හඳුනාගත හැකි අතර ඒවා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස යන සංරචකය යටතේ මාධ්‍ය නිදහසට එරෙහි ක්‍රියා ලෙස සැලකිය හැකිය.

## 3.5 තොරතුරු දැනගැනීමේ නිදහස

තොරතුරු සෙවීමට, ලබාගැනීමට සහ ඵලදායි ලෙස ලබා දීමට ඇති නිදහස ලෙස තොරතුරු දැනගැනීමේ නිදහස අර්ථ දැක්විය හැකිය.[35] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (අ) වගන්තියෙන් ශ්‍රී ලංකාව මෙම අයිතිය පිළිගෙන ඇති අතර එම අයිතිය සහතික කිරීම සඳහා විශේෂ නීතියක් ද ක්‍රියාත්මක කොට තොරතුරු කොමිසමක් පිහිටුවා ඉදිරිගාමී ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇත.[36]

මාධ්‍යවේදීන්ට ඔවුන්ගේ වාර්තාකරණ ක්‍රියාවලිය විධිමත් ලෙස පවත්වාගැනීමේ දී අවශ්‍ය නිවැරදි සහ අපක්ෂපාතී තොරතුරු ලබා ගැනීමට මෙම අයිතිය අතිශය වැදගත් වෙයි. කෙසේ වෙතත්, 2020 දී මෙම අයිතිය සම්බන්ධ ප්‍රශ්න ගණනාවක් හඳුනාගනු ලැබීය. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කටයුතු මාධ්‍යයට තහනම් කිරීම සැප්තැම්බරයේ සිදු විය.[37] ඔක්තෝබර් 08 දා, ප්‍රාදේශීය සභා රැස්වීමකින් මාධ්‍යවේදියකු බලහත්කාරයෙන් ඉවත් කරනු ලැබීය.[38] එපමණක් නොව, රජයේ ආයතනවල ප්‍රවෘත්ති නිලධාරීන් ප්‍රවෘත්ති ලබාදීමේදී කළ හේතු රහිත ප්‍රතික්ෂේප කිරීම් සහ හිතා මතා ප්‍රමාද කිරීම් සම්බන්ධයෙන් මාධ්‍යවේදීහු ගණනාවක් චෝදනා කළහ.[39] කොමසාරිස්වරුන් පත් කිරීම සඳහා පක්ෂග්‍රාහී යාන්ත්‍රණයක් හඳුන්වාදීම සහ ජනාධිපති විසින් කොමසාරිස්වරුන් ඉවත් කිරීම වැනි, තොරතුරු දැනගැනීමේ කොමිසමේ ස්වාධීනත්වයට ප්‍රධාන වශයෙන් බලපාන ඇතැම් නිශේධනාත්මක බලපෑම් 2020 වසරේදී ගෙන එනු ලැබූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනය මගින් ඇති කරනු ලැබීය.[40]

එබැවින්, තොරතුරු දැනගැනීමේ අයිතියට අදාළ, මාධ්‍ය නිදහසට එරෙහි විශේෂයෙන් සැලකිල්ලට ගත යුතු ප්‍රශ්න ගණනාවක් 2020 වසරේ දී මතු වූ බව සටහන් කළ යුතු වෙයි.

## 3.6 පටිගත කිරීමේ නිදහස

මාධ්‍ය නිදහසේ දර්ශක තුළ, පටිගත කිරීමේ නිදහස මූලික අයිතියකි. මාධ්‍ය පටිගත කිරීම යන්නෙන් වීඩියෝ, ඡායාරූප, හඬ පටිගත කිරීම් හෝ පෙළ වැනි ඕනෑම ආකාරයක වාර්තා කර ගැනීමක් අදහස් වෙයි.[41]

2020 දී සිදුවීම් ගැන බැලූ විට පෙනී යන්නේ සිදුවීම් ගණනාවක් පටිගත කිරීමේ නිදහසට එරෙහිව සිදු වූ බවයි. උදාහරණ ලෙස, ඇතැම් අවස්ථාවල, තොරතුරු පටිගත කිරීම සඳහා ප්‍රවේශ වීමට මාධ්‍යවේදීන්ට ඉඩ දෙනු නොලැබිණි.[42] එපමණක් නොව, ඔවුන් පටිගත කරමින් සිටියදී, ඔවුන්ට පහර දීම,[43] පහර දී අඩන්තේට්ටම් කිරීම,[44] තර්ජනය කිරීම[45] සහ තර්ජනය කොට බිය ගැන්වීම[46] සිදුව ඇත. විශේෂයෙන් උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවලත්, දිවයිනේ සෙසු ප්‍රදේශ ගණනාවකත් මෙවැනි සිදුවීම් වාර්තා වී ඇති අතර මේ පිළිබඳ සිදුවීම් රැසක් ඇමුණුම් එක යටතේ විස්තරාත්මකව සහ පසුබිම් වාර්තාවලට පිවිසිය හැකි දිගු සහිතව දක්වා තිබේ.

කෙසේ වෙතත්, පටිගත කිරීමේ අයිතිය යන්න නීතිමය සහ ආචාර ධාර්මික සීමා කිරීම්වලට යටත් වන බව සටහන් කිරීම අත්‍යවශ්‍යය. උදාහරණ ලෙස ඇතැම් ස්ථානවල ඡායාරූප ගැනීමට හෝ වීඩියෝ පටිගත කිරීම්වලට හෝ ඉඩ දෙනු නොලැබේ. එමෙන්ම, පටිගත කිරීම් සිදු කරන විට මහජනයාගේ පුද්ගලිකත්වය ද සැලකිල්ලට ගත යුතුය. ශ්‍රී ලංකාවේ දී, 2020 වසර තුළ ආචාරධර්ම විරෝධී පටිගත කිරීම් ගණනාවක් වාර්තා වී ඇත්තේ, ප්‍රධාන වශයෙන් කොවිඩ් ආසාදිත තැනැත්තන්ට එරෙහිවය.[47] සවිස්තරාත්මකව සඳහන් කළහොත් කොවිඩ් ආසාදිතයන් වාර්තා වූ විට සෞඛ්‍ය බලධාරීන් සහ පොලිසිය සමග විසින් ඔවුන් ප්‍රතිකාර සඳහා රැගෙන යන අවස්ථාවලට සම්බන්ධ වූ මාධ්‍යවේදීන් අදාළ අසාදිතයන්ද ඔවුන්ගේ සමීපතමයන්ද දේපළද රූගත කිරීම බහුලව දැකගත හැකිවූ අතර එය අචාරධර්ම මෙන්ම නීතියටද පටහැනිය. එහිදී එම මාධ්‍යවේදීන්ට එරෙහිවීම්ද නිරීක්ෂණය වූ අතර ඒවා පටිගත කිරීමේ නිදහසට බාධා එල්ලවීම් ලෙස අර්ථ ගැන්විය නොහැක.

එබැවින්, පටිගත කිරීමේ නිදහස නිරපේක්ෂ නිදහසක් නොවන බවත්, එය වගකීම් ගණනාවක් සමග එකට බැඳී ඇති බවත් සටහන් කිරීම අත්‍යවශ්‍ය වෙයි. ඒ අනුව, පටිගත කිරීමේ නිදහස භාවිත කරන විට එහි සියලු කලාප අනිවාර්යෙන්ම විශ්ලේෂණය කළ යුතු වන්නේය.

## 3.7 පළ කිරීමේ නිදහස

පළ කිරීමේ නිදහස යන්න "පුවත්පත් නිදහසේ" විෂය පථයට ඇතුළත් කළ හැකි අතර එය වෙනම සංරචකයක් ලෙස ද හඳුනාගැනීමේ හැකියාව ඇත. "පළ කිරීමේ නිදහස" යන්නෙන් සාමාන්‍යයෙන් අදහස් වන්නේ, පොතක්, සඟරාවක් හෝ එබඳු ඕනෑම පළ කිරීමක් ප්‍රකාශයට පත් කිරීමේ නිදහසයි. වාරණයක් ක්‍රියාත්මක නොවීම, ආණ්ඩුවේ හෝ වෙනත් ඕනෑම පාර්ශ්වයක හෝ අනුමැතියකට යටත් නොවීම, ප්‍රකාශනයට සහ බෙදාහැරීමට අවස්ථාව තිබීම, පළ කිරීමේ නිදහසට ඇතුළත්ය.

ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වැනි වගන්තිය මගින් පළ කිරීමේ

නිදහස සහතික කොට ඇත. කෙසේ වෙතත්, "බුදුන්ගේ රස්තියාදුව" පොත සම්බන්ධයෙන් කේ. කේ. ශ්‍රීනාත්ට එරෙහිව කළ පැමිණිල්ල වැනි මෙම නිදහසට එරෙහි සිදුවීම් කිහිපයක් මෑතක දී වාර්තා විය.[48] තරුණ මුස්ලිම් කවියකු වූ අහ්නාෆ් ජසීම්ගේ දෙමළ භාෂා කවි පොතෙහි 'අන්තවාදී' පණිවුඩයක් අඩංගු බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තීරණය කිරීමෙන් පසුව ඔහු ත්‍රස්තවාදී චෝදනා මත 2020 මැයි මාසයේ රඳවා ගනු ලැබීය. කෙසේ වෙතත්, පිළිගත් දෙමළ විද්වතුන් සහ ලේඛකයින් ගණනාවක් බලධාරීන්ගේ මෙම චෝදනා ප්‍රතික්ෂේප කර ඇත.[49] පොතක් පළ කිරීම මාස ගණනාවක් රක්ෂිත බන්ධනාගාරගත කිරීමකට හේතු වන්නේ නම් එම තත්වය පළ කිරීමේ නිදහසට ඉතා අහිතකර පසුබිමක් බව සඳහන් කළ යුතු වේ.

ඒ අනුව විශේෂයෙන් නිරීක්ෂණය කළ හැක්කේ, පළ කිරීමේ නිදහසට එරෙහි ප්‍රවණතා ප්‍රධාන වශයෙන් ගොඩ නැගෙන්නේ ආගමික දෘෂ්ටි කෝණ පදනම් කරගෙන බවයි. මෙම නිදහස සීමා කිරීමට ඇතැම් අන්තවාදී කණ්ඩායම් සහ බලධාරීන් ක්‍රියා කරන අතර එමගින් ලේඛකයින්, මාධ්‍යවේදීන් සහ ප්‍රකාශකයින් මත බියක් සහ පූර්ව වාරණයක් ඇති කරයි.

## 3.8 පුවත්පත් නිදහස

මුල් කාලයේ මෙම දර්ශකයේ සියලුම අයිතීන් වාගේ පුවත්පත් නිදහස යන්නෙන් ආවරණය විය.[50] කෙසේ වෙතත්, තාක්ෂණයේ සහ නීතියේ වර්ධනයත් සමඟ මෙම අයිතියේ විෂය පථය සැලකිය යුතු ලෙස වර්ධනය විය. එබැවින්, වර්තමානයේදී පුවත්පත්වලට සම්බන්ධ සියලුම අයිතීන් සහ නිදහස, පුවත්පත් නිදහස යන්නට ඇතුළත් කළ හැකි වෙයි.[51] මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව, මුද්‍රණය කිරීමේ සහ බෙදාහැරීමේ නිදහස, වාරණයෙන් තොර වීම සහ කර්තෘ මණ්ඩල ස්වාධීනත්වය ආදී පුවත්පත් ක්ෂේත්‍රයට සම්බන්ධ සියලු අයිතීන් එමගින් ලබා දෙයි.

ශ්‍රී ලංකාවේ පුවත්පත් නිදහසට එරෙහිව සිදුවීම් ගණනාවක් 2020 දී සිදු විය. උදාහරණයක් ලෙස ලංකාදීපයේ මාධ්‍යවේදිනියකට පෞද්ගලික පාර්ශ්වයකින් මරණීය තර්ජන එල්ල වූ අතර පොලිසිය ඇයට පරිභව කළේය.[52] එමෙන්ම, මුද්‍රිත මාධ්‍යවේදීහු ගණනාවක් පහර කෑමට, තර්ජනයට සහ බිය වැද්දීමට ලක් වූහ.[53] මෙම සිදුවීම්වලට අමතරව, කර්තෘ මණ්ඩල ස්වාධීනත්වය නැති වීම, මූලික කම්කරු අයිතීන් උල්ලංඝනය වීම, වැටුප් අඩු කිරීම සහ කොවිඩ් 19ට එරෙහිව ආරක්ෂක පියවර අනුගමනය නො කිරීම වැනි ප්‍රශ්න ගණනාවකට මුහුණදීමට මුද්‍රිත මාධ්‍යවේදීන්ට සිදු වී තිබේ.[54]

## 3.9 විකාශනයේ නිදහස

රජයේ, දේශපාලන හෝ වාණිජමය මැදිහත්වීම්වලින් තොරව සහ තොරතුරු සහ අදහස්වල උපරිම විවිධත්වයක් මහජනයාට සපයන ගුවන්විදුලි, රූපවාහිනී හෝ වෙනත් ඕනෑම විකාශනයක් සඳහා වන නිදහස ලෙස විකාශනයේ නිදහස අර්ථ දැක්විය හැකිය. තව ද, විකාශනයේ අන්තර්ගතය, රජයේ හෝ නියාමන ආයතනවල හෝ වාරණයට ලක් නොවිය යුතුය. අන්තර්ගතයක් සම්බන්ධයෙන් නියාමන නීති උල්ලංඝනයක් කිරීම මත කුමන හෝ සම්බාධක පැනවිය යුතු වන්නේ ප්‍රශ්නයට අදාළ දේ විකාශය කිරීමෙන් පසුව පමණකි.[55]

ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ, විකාශනයේ නිදහසට අදාළ ප්‍රශ්න ගණනාවක් ඇත. ගුවන්විදුලි සහ රූපවාහිනී නාලිකාවන්ට බලපත්‍ර ලබාදීමේ, තරංග වෙන් කිරීමේ සිට අන්තර්ගතය නියාමනය දක්වා වගවීම් යාන්ත්‍රණයක් ශ්‍රී ලංකාවේ නැත. මහජන භාරයකින් වෙනුවට මෙබඳු සියලු ක්‍රියා මෙහෙයවනු ලබන්නේ දේශපාලන, පෞද්ගලික හෝ ආර්ථික න්‍යාය පත්‍ර අනුවය.[56]

මෙම පසුබිම යටතේ, තොරතුරු සහ අදහස්වල උපරිම විවිධත්වයක් ලැබීමේ පුරවැසි අයිතිය අවහිර වී ඇති අතර විවිධ වර්ගයේ මැදිහත්වීම් වලින් පිරී ඇත. එලෙස, විකාශනයේ නිදහස සීමා වී ඇති අතර ඒ තුළ ඇති අයිතීන් ජනතාවගෙන් සහ මාධ්‍යවේදීන්ගෙන් උදුරා ගෙන ඇත. තව ද, මාධ්‍යවේදීන් ස්වයං වාරණයට සහ රැකියා අවසන් කිරීමට ගොදුරු වී ඇති බව නිරීක්ෂණය විය.[57]

මේ අනුව පැහැදිලි වන්නේ මහජන දේපළක් වන විද්‍යුත් සංඛ්‍යාත ශ්‍රී ලංකාව තුළ භාවිතා කිරීමේදී ඊට අදාළ විකාශන නිදහසේ මූලිකාංග පිළිබඳව දක්වන සැලකිල්ල අවම බවයි. වසර ගණනාවක සිට අඛණ්ඩව පැවත එන එම තත්ත්වය 2020 වසරේදීත් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වී ඇති බව පෙනේ.

## 3.10 අන්තර්ජාල නිදහස

පවතින මාධ්‍ය නිදහස් සන්දර්භය තුළ අන්තර්ජාල නිදහස යන්න මූලික සංරචකයක් බවට පත්ව ඇත. කිසිදු සීමා කිරීමකින් තොරව අන්තර්ජාලයේ සමාන සහභාගීත්වය, ප්‍රවේශය සහ භාවිතය මෙම නිදහසට ඇතුළත්ය. ඊට අමතරව ප්‍රකාශනයේ නිදහසට අදාළ සියලු අයිතීන් අන්තර්ජාලය තුළදීත් භුක්ති විඳීම සහතික කිරීම මෙමගින් සිදුවෙයි.[58]

ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ වෙබ් සහ අන්තර්ජාලය තුළ ප්‍රකාශනයේ අයිතියට හිතකර තත්ත්වයක් නැති බව නිරීක්ෂණය කළ හැකිය. අන්තර්ජාල මාධ්‍යවේදීන් සහ බ්ලොග්කරුවන් පහර දීමට ලක්වීම, ඔවුන්ට යම් යම් වාරණ පැනවීම් සහ අන්තර්ජාල මාධ්‍ය ආයතන සෝදිසි කිරීම්, වෙබ් අඩවි අවහිර කිරීම ඊට විවිධ අන්දමින් බාධා කිරීම් පිළිබඳ සිදුවීම් ගණනාවක් මගින් මෙම තත්ත්වය ප්‍රදර්ශනය වෙයි.[59]


2020 දී අන්තර්ජාල මාධ්‍යවේදීන් ගණනාවකට නීතිමය ක්‍රියාමාර්ගවලට මුහුණ දීමට සිදු විය.[60] තව ද, වෙබ් අඩවියක් අවහිර කරනු ලැබූ අතර[61] පිටුවහල් කරනු ලැබූ මාධ්‍යවේදියකුගේ පරිගණකය

විමර්ශකයන් භාරයට ගත්තේය.[62] වසර අවසානයේ දී මාධ්‍ය ඇමතිවරයා ප්‍රකාශ කළේ අන්තර්ජාල සහ සමාජ මාධ්‍ය පාලනයට ආණ්ඩුව සැලසුම් කරන බවයි.[63] අනෙක් අතට, මෙම අයිතිය භුක්ති විඳීමට සහ තහවුරු කර ගැනීමට, වෛරී ප්‍රකාශ සහ වැරදි ප්‍රචාර මගින් අයහපත් බලපෑමක් ඇති කොට තිබේ.[64] මේ සියලු තත්ත්වයන්ගේ ප්‍රතිඵලය වී ඇත්තේ ශ්‍රී ලංකාවේ අන්තර්ජාල නිදහස අයහපත් වීමයි.

ඒ අනුව ඉතා පැහැදිලිව පෙනී යන්නේ, 2020 වසර තුළ දී, ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස පිළිබඳ සංරචක දහයම, බොහෝ ආකාරවලින් අයහපත් බලපෑමට ලක්ව ඇති බවයි. පටිගත කිරීමේ නිදහස, පුවත්පත් නිදහස, අන්තර්ජාල නිදහස වැනි ඇතැම් සංරචක බරපතළ ලෙස බලපෑමට ලක්ව ඇත. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ සිතීමේ නිදහස වැනි ඇතැම් සංරචක සාපේක්ෂ වශයෙන් අඩු බලපෑමකට ලක්ව ඇත. කෙසේවෙතත්, අන්තර් සම්බන්ධතාව සහ එකක් මත එකක් පැවතීම නිසා නිදහස් සංරචක දහයට අදාළ බලපෑම ගැන වෙන් වෙන්ව විශ්ලේෂණය කර ඒ පිළිබඳ නිගමන ඉදිරිපත් කිරීම වැරදි අවබෝධයක් ඇති කළ හැකිය. එබැවින්, වඩාත් හොඳ ප්‍රවේශය වන්නේ ඒවා එකට ගෙන මැන බලා සමස්ත තත්වය පිළිබඳ නිගමනයක් ඉදිරිපත් කිරීමයි. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස් සංරචක කිසිවක් සම්පූර්ණයෙන් ම ආරක්ෂිත නොවන බව තේරුම් ගැනීමට මෙම සංරචකයන්ට සිදුව ඇති බලපෑම වෙන් වෙන්ව තක්සේරු කිරීම ඉතා වැදගත් වෙයි.

මාධ්‍ය නිදහසට එරෙහිව 2020 වසරේ සිදුවීම් සලකා බලන විට, නිදහස් සංරචකවලට අයහපත් ලෙස බල පෑ විවිධ සිදුවීම් හඳුනා ගත හැකිය. තවද, රජය සහ පෞද්ගලික පාර්ශ්ව මාධ්‍ය නිදහසට එරෙහිව සැලකිය යුතු ආකාරයෙන් ක්‍රියාත්මක විය. මෙම සාධක දෙකම මීළඟ පරිච්ඡේදයේ ගැඹුරින් පරීක්ෂාවට ලක් වෙයි. කෙසේවෙතත් සිදුවීම්, සංරචක කෙරෙහි ඒවායේ බලපෑම සහ අන්තර් සම්බන්ධතා අවබෝධ කර ගැනීමට පහත ප්‍රස්ථාරය වඩාත් උපකාරී වෙයි.

**1 වන රූපය - සන්නිවේදන නිදහස් සංරචක දහයේ සමූහය**



# 4. 2020 දී මාධ්‍ය නිදහසට එරෙහි ක්‍රියා සහ වර්ගීකරණය



මානව හිමිකම් ක්‍රියාකාරිනියක වන සන්ධ්‍යා එක්නැලිගොඩ මහත්මිය විසින් අතුරුදහන්වුවන් ගේ කාර්යාලයේ සභාපති ධුරය සඳහා අතුරුහන් කිරීම් සම්බන්ධයෙන් නඩු පවරා ඇති පුද්ගලයෙකු පත් කිරීම සම්බන්ධයෙන් සිය විරෝධය පළ කරමින් එම පත් වීම අවලංගු කරන ලෙසට ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටියාය.
www.aithiya.lk

2020 දී මාධ්‍ය නිදහසට අදාළ, ප්‍රසිද්ධියේ ලබාගත හැකි සහ සාකච්ඡාවට ලක් වූ සිදුවීම්/ප්‍රශ්න 58ක් පර්යේෂක විසින් ලැයිස්තු ගත කරනු ලැබීය.[65] ප්‍රධාන දේශීය මාධ්‍ය නිරීක්ෂකයින්ගේ සංඛ්‍යාවලට වැඩි සිදුවීම් ප්‍රමාණයක් ලැයිස්තුවට ඇතුළත් වුවද,[66] වසර තුළ මාධ්‍ය නිදහසට එරෙහි සියලු ප්‍රශ්න හෝ සිදුවීම් එම ලැයිස්තුවෙන් ආවරණය වන බව එයින් අදහස් නොවේ. එසේ වුවද, ප්‍රශ්න සහ සිදුවීම් සන්දර්භයේ පුළුල් චිත්‍රයක් මෙමගින් ඉදිරිපත් කරන අතර ප්‍රශ්න සහ සිදුවීම් වර්ගීකරණයට මෙන්ම මාධ්‍ය නිදහසට එරෙහි ප්‍රධාන ක්‍රියාකාරීන් හඳුනා ගැනීමට ද එය ආධාර වෙයි. තවද, මාධ්‍ය නිදහසට එරෙහි මෙම ක්‍රියා, ස්වරූප නොඑසේ නම් මාන, මාධ්‍ය නිදහසේ තත්ත්වය පරීක්ෂා කිරීමේ දර්ශක ලෙස ද යොදාගනු ලැබීය.

මාධ්‍ය නිදහසට එරෙහි කාණ්ඩ, ස්වරූප හෙවත් මාන සහ වගකිව යුතු පාර්ශ්ව යටතේ සංඛ්‍යා සමග 2020 වසරේ ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසට එරෙහි ප්‍රශ්න පහත වගුවෙන් විස්තර කෙරෙයි.

මෙහි දක්වා ඇති පරිදි 2020 දී ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසට එරෙහි සිදුවීම හෝ ප්‍රශ්න, මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව, නීතිමය තත්ත්වය, මාධ්‍යයේ ස්වාධීනත්වය සහ වෘත්තීයභාවය යන ප්‍රධාන කාණ්ඩ හෙවත් මාන හතරක් යටතේ හඳුනා ගත හැකිය.

මෙම කාණ්ඩ හෙවත් මානයන්ගෙන් විවිධ කලාප ආවරණය කර ඇති අතර ඇතැම් සිදුවීම් මෙම කාණ්ඩ සහ මාන දෙකකට හෝ ඊටත් වැඩියෙන් ඇතුළත් කළ හැකි අවස්ථාද පවතී. උදාහරණයක් ලෙස එක් මාධ්‍යවේදිනියක මැර තර්ජනයකට ලක් වූ විට එය ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් විය. ඇය මේ පිළිබඳ පොලිසියට පැමිණිළි කළ අතර එහිදී නිසි ලෙස නීතිය ක්‍රියාත්මකවීම සිදු නොවීය. ඒ අනුව මෙම සිදුවීම ආරක්ෂාව පිළිබඳ මානය තුළට මෙන්ම නීතිය පිළිබඳ මානය තුළටද ඇතුළත් කළ හැකි වේ.

එමෙන්ම ඇතැම් අවස්ථාවල මෙම මාන යටතේ එන සිදුවීම්ද ස්වරූප කිහිපයක් ඔස්සේ ක්‍රියාත්මක වී ඇති බව නිරීක්ෂණය කළ හැකි විය.

### වගුව 02 - 2020 දී මාධ්‍ය නිදහසට එරෙහි ප්‍රශ්න

| ප්‍රධාන කාණ්ඩය | ස්වරූපය | වගකිව යුතු පාර්ශව |
|---|---|---|
| ජනමාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව (33) | පහර දීම් (07)<br>පහර දී අඩන්තේට්ටම් කිරීම් (02)<br>තර්ජනය කිරීම් (13)<br>බියවැද්දීම් (04)<br>බාධා කිරීම් (02)<br>උපකරණ සොරාගැනීමට ලක්වීම් (01)<br>පෞද්ගලික තොරතුරු රැස් කිරීම (01)<br>සංවිධානාත්මක වෛරී ප්‍රකාශ (02)<br>සංවිධානාත්මක අසාධාරණකම් (01) | පොලිසිය<br>හමුදාව<br>රජයේ නිලධාරීන්<br>පිටස්තර කණ්ඩායම්<br>හඳුනා නොගත් තැනැත්තෙක්<br>දේශපාලන කණ්ඩායමක් |
| නීතිමය තත්ත්වයන් | අත්අඩංගුවට ගැනීම් (05)<br>ප්‍රවේශයට ඉඩ නොදීම් (05)<br>පොලිසියේ මඟහැරීම (01)<br>මූලාශ්‍ර සොයා ගැනීමට පරීක්ෂණ (01)<br>ප්‍රශ්න කිරීම් (03)<br>පොලිසියෙන් කැඳවීම් (01)<br>මාධ්‍ය උපකරණ පැහැර ගැනීම් (02)<br>පාලන යාන්ත්‍රණයක් හඳුන්වා දීම හෝ හඳුන්වා දීමට උත්සාහ දැරීම (01)<br>නඩු පැවරීම් (01) | පොලිසිය<br>ආණ්ඩුව |
| මාධ්‍යයේ ස්වාධීනත්වය (03) | හැක් කිරීමට ගොදුරු වීම් / සයිබර් ප්‍රහාර (01)<br>වෙබ් අඩවි අවහිර කිරීම් (01)<br>විකාශන නැවත්වීම (01) | අන්තවාදී කණ්ඩායම්<br>ආණ්ඩුව<br>මාධ්‍ය හිමිකරුවන් |
| වෘත්තීයභාවය (02) | සේවය අවසන් කිරීම් (01)<br>විනය පියවර ගැනීම් (01) | මාධ්‍ය හිමිකරුවන් |

උදාහරණයක් ලෙස ආරක්ෂාව පිළිබඳ මානයට පහර දීම, පහර දී අඩන්තේට්ටම් කිරීම, තර්ජනය කිරීම වැනි ස්වරූප හෝ ක්‍රියා ගණනාවක් ඉහත වගුවෙන් විස්තර කෙරෙයි. කෙසේවෙතත්, ඇතැම් සිදුවීම් හෝ ප්‍රශ්නවලදී ක්‍රියා දෙකක් හෝ තුනක් එකවර සිදු වී ඇති බව සටහන් කිරීම වැදගත් වෙයි. උදාහරණයක් ලෙස පහරදීමකට, තර්ජනය, බියවැද්දීම සහ බාධා කිරීම ද ඇතුළත් විය හැකිය. කෙසේ වෙතත්, එක් සිදුවීමක් හෝ ගැටලුවක් අවස්ථා කිහිපයක් තුළ සලකා බැලීම වැළැක්වීමටත් ඒ හරහා පර්යේෂණ වැරදි අවම කර ගැනීම සඳහාත් ප්‍රශ්නයක් හෝ සිදුවීමක් එක් ස්වරූපයක් පමණක් හා සම්බන්ධ කොට ඇත. එබඳු අවස්ථාවල දී ස්වරූප අතරින් වඩාත්ම අදාළ එක සැලකිල්ලට ගනු ලැබීය.

2020 දී රටේ මාධ්‍ය නිදහසට එරෙහි වඩාත්ම පොදු කාණ්ඩය හෝ මානය වූයේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව පිළිබඳ ගැටලු හෙවත් ප්‍රශ්නයි. තර්ජනය කිරීම් 13ක්, පහරදීම් 07ක්, බියවැද්දීම් 04ක් සහ තවත් දේ එයට ඇතුළත්ය. දෙවැනි වඩා පොදු කාණ්ඩය හෝ මානය වූයේ අත්අඩංගුවට ගැනීම් 05ක්, ප්‍රවේශයට ඉඩ නොදීම් 05ක් වැනි සිදුවීම් ඇතුළත් නීතිමය තත්ත්වයන්ය. මාධ්‍යයේ ස්වාධීනත්වය කාණ්ඩයට, සයිබර් ප්‍රහාර, වෙබ් අඩවියක් අවහිර කිරීම සහ විකාශයන් නැවත්වීම ඇතුළත්ය. වෘත්තීයභාවය පිළිබඳ ප්‍රශ්න ලෙස වෘත්තියට අදාළ කම්කරු අයිතීන්ද සලකා බලනු ලැබ ඇති අතර ඒ අනුව සේවය අවසන් කිරීම





© @Nikshazz Sajith Bandara

සහ විනය පියවර ගැනීම පිළිබඳ ප්‍රශ්න ද එම මානය යටතේ සලකා බලනු ලැබීය. (සම්පූර්ණ දත්ත සඳහා 02 වගුව බලන්න)

මාධ්‍ය නිදහසේ ප්‍රශ්න පිළිබඳ කාණ්ඩ පහත සඳහන් ලෙස තව දුරටත් විස්තර කෙරෙයි.

### 1 සටහන - 2020 දී මාධ්‍ය නිදහසට එරෙහි ප්‍රධාන ප්‍රශ්න/කාණ්ඩ




දැනට පවතින ලිපි ලේඛන සහ වාර්තා මගින්, ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසට එරෙහි සහ මාධ්‍ය අයිතීන් උල්ලංඝනය කිරීම් පිළිබඳව ප්‍රශ්න ඉහත දක්වා ඇති පරිදි වර්ගීකරණයන් හෙවත් මානයන් හතරක් හඳුනා ගැනීමට දත්ත සපයා ඇත. කෙසේවෙතත් එහිදී ද මාධ්‍යය ස්වාධීනත්වය සහ වෘත්තීයභාවය පිළිබඳ මාන පුළුල්ව හඳුනාගැනීමක් සිදු කර නොමැති බවක්ද නිරීක්ෂණය කළ හැකිය. විශේෂයෙන් කර්තෘ මණ්ඩල ස්වාධීනත්වය වැනි ක්ෂේත්‍ර පිළිබඳ හඳුනාගෙන තිබුණේ අවම වශයෙනි. දේශීය නිරීක්ෂකයින් විසින් ප්‍රමාණවත් ලෙස පරීක්ෂා නොකළ එබඳු මානයන් මෙන්ම කිසිදු ආකාරයකට අවධානයට ලක් නොකෙරුණු එහෙත් මාධ්‍ය නිදහස පිළිබඳ විධිමත් තක්සේරුවකදී අනිවාර්යයෙන්ම සලකා බැලිය යුතු තවත් ක්ෂේත්‍ර නොඑසේ නම් මාන කිහිපයක්ම ඇති බව පර්යේෂකගේ නිරීක්ෂණය විය. පෞද්ගලික නිරීක්ෂණ සහ ගැඹුරට කළ සම්මුඛ සාකච්ඡා මගින් රැස් කර ගත් ආනුභවික දත්ත මගින් පෙන්නුම් කළේ ව්‍යුහාත්මක ප්‍රශ්න, සහභාගීත්වය, සහ මාධ්‍ය නිෂ්පාදනවල විවිධත්වය සහ ගුණාත්මක බව, සවිස්තරාත්මකව නිරීක්ෂණය කොට සහ හඳුනාගෙන නැති බවයි.

ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ මාධ්‍යයේ ව්‍යුහය පිළිබඳව නීති හෝ ප්‍රතිපත්ති හෝ නැත. එබැවින් මුද්‍රිත, ගුවන්විදුලි, රූපවාහිනී සහ අන්තර්ජාල ඇතුළු සෑම මාධ්‍ය වර්ගයක්ම ක්‍රියාත්මක කිරීමට හිමිකරුවන්ට හැකියාව ඇත. විකාශන සංඛ්‍යාත බෙදා දීමේ විධිමත් ක්‍රමවේදයක් නැත. ඒ අනුව, මාධ්‍ය බහුත්වවාදය, මාධ්‍ය හිමිකාරීත්වය, නිෂ්පාදනයන්ගේ ස්වාධීනත්වය සහ මහජන සේවා විකාශනය ආදිය මාධ්‍ය නිදහසට එරෙහි ප්‍රශ්න බවට පත්ව තිබේ. මූලික වශයෙන් විකාශන මාධ්‍යයේ ඇති මෙබඳු ප්‍රශ්න, මාධ්‍ය නිදහසේ නිරීක්ෂකයින් සහ සහ ඔවුන්ගේ දර්ශක මගින් ප්‍රමාණවත් ලෙස ආවරණය කොට නැත.

සමාජයේ සියලුම සාමාජිකයින් මාධ්‍ය සන්දර්භයේ පාර්ශ්වකරුවන් හෙවත් කොටස්කරුවන් විය යුතුය. වඩාත් නිශ්චිතව කියන්නේ නම්, මාධ්‍ය ක්ෂේත්‍රයේ සහභාගීත්වයේ දී, සියලු ලිංගිකයින්, ආගමිකයින්, ජනවර්ග සහ වෙනත් කණ්ඩායම් සාධාරණ ලෙස ඇතුළත් විය යුතුය. එමගින් පිළිවෙළින්, සිතීමේ නිදහස, මත දැරීමේ නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ අවසානයේ මාධ්‍ය නිදහසේ පුළුල් පරාසයක් තහවුරු කරනු ඇත. පර්යේෂකගේ සොයාගැනීම් මත පදනම්ව කිව හැක්කේ මාධ්‍ය කර්මාන්තයේ වඩා හොඳ සහභාගීත්ව ප්‍රතිපත්තියක් පවත්වාගෙන යෑම සඳහා පවතින ප්‍රතිපත්ති, නීති සහ භාවිතයන් ප්‍රමාණවත් නොවන බවයි. මෙම ක්ෂේත්‍රයට නිරීක්ෂකයින් සහ දර්ශක සැලකිය යුතු ලෙස ප්‍රවේශ වී නැත.

මාධ්‍ය නිදහස වැඩිදියුණු කිරීම සඳහා මාධ්‍ය නිෂ්පාදනවල විවිධත්වයේ සහ ගුණාත්මකභාවයේ ඉහළ තත්ත්වයක් පැවතීම අවශ්‍ය වෙයි. උදාහරණයක් ලෙස, සියලු ප්‍රජාවන්ගේ සියලුම මානව හිමිකම් ප්‍රශ්න මාධ්‍යය මගින් ආවරණය කළ යුතුය. එමෙන්ම, එහි අන්තර්ගතයට අදාළ සියලු පාර්ශ්වයන්ගේ හඬ ඇතුළත් විය යුතු අතර වැරදි තොරතුරු සහ වෛරී ප්‍රකාශ මගින් කැළැල් නොවිය යුතුය. ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ නිරීක්ෂණය වූයේ මෙම සන්දර්භයේ ප්‍රශ්න ගණනාවක් ඇති බවයි. 2020 වසරේ ශ්‍රී ලංකාවේ මාධ්‍ය තුළ සැලකිය යුතු ප්‍රශ්නයක් වූයේ කොවිඩ් 19 වසංගතය සම්බන්ධ වැරදි තොරතුරු සහ වෛරී ප්‍රකාශයි. පර්යේෂක විසින් නිරීක්ෂණය කළ ආකාරයට, මාධ්‍ය නිදහසට එරෙහි මෙබඳු තර්ජන හඳුනා ගැනීමට සහ මැන බැලීමට වඩා හොඳ ප්‍රවේශයක් මාධ්‍ය නිරීක්ෂකයින් සහ ඔවුන්ගේ දර්ශක මගින් යොදාගෙන නැත.

මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව, නීතිමය තත්ත්වය, මාධ්‍යයේ ස්වාධීනත්වය පිළිබඳ ප්‍රශ්න සහ වෘත්තියවේදය ආදියට අදාළ බොහෝ ප්‍රශ්න, නිරීක්ෂකයින් සහ දර්ශක මගින් පරීක්ෂා කිරීම සහ විස්තර කිරීම කරනු ලැබුවද, ඒවා තවත් වර්ධනය කළ යුතුව ඇත.

පර්යේෂකගේ නිරීක්ෂණ අනුව, ජනමාධ්‍යවේදීන්ට




සන්ඩේ ඔබ්සවර් පුවත්පතේ හිටපු කර්තෘ සහ නිව්යෝර්ක් ටයිම්ස් පුවත්පතේ වාර්තාකාරිණී දරිශා බැස්ටින් සම්බන්ධයෙන් කරනු ලබන හිංසනයන් අවසන් කරන ලෙස ඉල්ලා ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් සංවිධාන පහක් ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා ඇත. www.newswire.lk

එරෙහිව, පොලිසිය, ආරක්ෂක හමුදා සහ ආණ්ඩුවේ වෙනත් බලධාරීන් විසින් දැවැන්ත ආවේක්ෂණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරනු ලැබීය.[67] එම ක්‍රියාවලිය මගින් මාධ්‍යවේදියකුගේ පෞද්ගලිකත්වයේ අයිතිය උල්ලංඝනය කළ අතර සිතීමේ සහ මත දැරීමේ නිදහස වැනි මූලික මානව අයිතීන්ට නරක ලෙස බලපෑම් කළේය. එබැවින් සෝදිසි කිරීම් මාධ්‍ය අයිතීන් උල්ලංඝනය කිරීමේ ස්වරූපයක් ලෙස නිරීක්ෂකයින් විසින් සැලකිය යුතු අතර එය මැන බැලීමට උප දර්ශක ක්‍රියාත්මක කළ යුතුය.

වර්ෂය තුළ දී, නීතිමය තත්ත්වයන් යන මානය මූලික මාධ්‍ය නිදහස් ප්‍රශ්නයක් බවට පත් විය. නිරීක්ෂකයෝ ද ඔවුන්ගේ දර්ශක මගින් මාතෘකා ගණනාවක් ආවරණය කළහ. කෙසේ වෙතත්, පර්යේෂක විසින් නිරීක්ෂණය කරනු ලැබූ ආකාරයට දණ්ඩමුක්තිය පිළිබඳ සිදුවීම් ආවරණය සඳහා තවත් දර්ශක තිබිය යුතුය. උදාහරණ ලෙස, ලසන්ත වික්‍රමතුංග ඝාතනය සහ ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදන් වීම ඇතුළු මාධ්‍ය නිදහසට අදාළ ඇතැම් නඩු විභාගයට ගනු ලැබිණ. කෙසේ වෙතත්, නඩු විභාග කිරීමේ ක්‍රියාවලිය සහ වැඩිදුර පරීක්ෂණ කටයුතු සිදු වූයේ බියවැද්දීම් ගණනාවක් සහ හිතා මතා ප්‍රමාද කිරීම්වලට ද ලක් වෙමිනි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්ථාපිත කර තිබූ අධිකරණයේ ස්වාධීනත්වයට අදාළ ඇතැම් කරුණු 20 වැනි සංශෝධනය මගින් සංශෝධනය කිරීම හරහා මාධ්‍යවේදීන්ට එරෙහි අපරාධ සම්බන්ධයෙන් අඛණ්ඩව දණ්ඩමුක්තිය ක්‍රියාත්මක වීම කෙරෙහි ඇති වූ බලපෑම හොඳින් නිරීක්ෂණය කළ යුතුය. එබැවින්, පුවත්පත් නිවේදන නිකුත් කිරීම සහ වාර්ෂිකව අනුස්මරණ අවස්ථා පැවැත්වීමට සමගාමීව මේ පිළිබඳ යුක්තිය පසිඳලීමේ කඩිනම් කිරීමේ සහ ඉටු කර ගැනීමේ ක්‍රියාවලිය විවිධ සහ නව ප්‍රවේශවලින් සන්නද්ධ කළ යුතුය. විවිධ ඉදිරි දර්ශන අනුව මාධ්‍ය නිදහසට නිශේධාත්මක ලෙස පෙනී යා හැකි බොරු පැමිණිලි දැමීම, අනවශ්‍ය සිතාසි නිකුත් කිරීම සහ මාධ්‍යවේදීන්ට එරෙහිව අසාධාරණ ලෙස ප්‍රශ්න කිරීම ගැන අවධානය යොමු කොට පරීක්ෂා කළ යුතුය. එබඳු ක්‍රියා මගින් මාධ්‍යවේදීන් තුළ අනවශ්‍ය ලෙස බියක් ඇති කරන අතර ඔවුන් මාධ්‍යවේදී වෘත්තියෙන් ඉවත් වීමට ද එය හේතු විය හැකිය.

මාධ්‍ය ස්වාධීනත්ව මානයේ එක් අත්‍යවශ්‍ය සංරචකයක් වන්නේ, අභ්‍යන්තර හෝ බාහිර හෝ පීඩාවන්ගෙන් තොරව රාජකාරි කිරීමේ අවස්ථාවයි. මෙම දර්ශනයේ ඉතාම තීරණාත්මක අංගයක් වන්නේ කර්තෘ මණ්ඩල ස්වාධීනත්වයයි. හිමිකරුවන්ගෙන් සහ කළමනාකරණයෙන් කර්තෘ මණ්ඩලයට ඇති නිදහස මෙන්ම, කර්තෘගෙන් මාධ්‍යවේදියාට ලැබෙන ඉඩ යන දෙකම එයට ඇතුළත්ය. මෙහිදී නිරීක්ෂණය කළ හැකි වූ විශේෂ තත්වයක් වූයේ ආණ්ඩුවේ මැදිහත්වීම්, දේශපාලන, ආගමික සහ සංස්කෘතික කණ්ඩායම්වලින් එල්ල වන පීඩනය සාපේක්ෂව ඉහළ මට්ටමක පවතින බවයි. උදාහරණයක් ලෙස, ඕනෑම ප්‍රවෘත්තියක් ප්‍රචාරය කිරීමට පෙර හිමිකරුගේ අවසරය ලබා ගැනීමට තමන්ට සිදු වී ඇති බව, ඇතැම් විද්‍යුත් මාධ්‍යවේදීහු හෙළිදරවු කළහ. ඊට අමතරව, ප්‍රවෘත්ති වෙබ් අඩවි ලියාපදිංචි කිරීමට ආරක්ෂක අංශවල අනුමැතිය ගැනීමේ ක්‍රියාවලියක් ආණ්ඩුව ක්‍රියාවට නගා ඇති බව ඇතැම් මූලාශ්‍ර හෙළිදරව් කළේය. දේශපාලන, ජනවාර්ගික සහ ආගමික කණ්ඩායම් ප්‍රධාන වශයෙන් පුවත්පත් රූපවාහිනිය සහ ගුවන්විදුලිය ඇතුළු මාධ්‍ය තමන්ට රිසි ලෙස මෙහෙයවීමට විවෘතව විවිධ බලපෑම් කරන බව ඇතැම් මාධ්‍යවේදීහු හෙළිදරව් කළහ. පර්යේෂකගේ නිරීක්ෂණ මගින් පෙන්නුම් කරන්නේ, මාධ්‍ය නිදහසට නිෂේධනාත්මක බලපෑමක් ඇති කරන මෙබඳු ප්‍රශ්න පිළිබඳව, ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිරීක්ෂකයින් සහ ඔවුන්ගේ දර්ශක මගින් ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය කොට නැති බවයි.

ආචාරධර්ම සංග්‍රහ පැවතීම, ආචාරධර්ම සහ වෘත්තිය සංග්‍රහ පිළිපැදීම, මාධ්‍යවේදීන්ගේ සහ අනෙක් මාධ්‍ය සේවකයන්ගේ වෘත්තීමය ආරක්ෂාව, කම්කරු අයිතීන්, වැඩ කරන තත්ත්වයන්, පුහුණුව සහ මාධ්‍යවේදීන්ගේ අධ්‍යාපනය ආදිය මාධ්‍ය වෘත්තීයමයභාවයට ඇතුළත්ය. ශ්‍රී ලංකාවේ විකාශන මාධ්‍යයට ආචාරධර්ම සංග්‍රහයක් නැති අතර මුද්‍රිත මාධ්‍යයට තමන්ගේම ආචාරධර්ම සංග්‍රහයක් ඇතත්





කෝවිඩ්-19 දැඩි වසංගත තත්ත්වය යටතේ පනවා ඇති ඇඳිරි නීතිය බලාත්මකව පවතින විට ආරක්ෂා හමුදා විදි සංචාරය කරනු ලබන පසුබිමක් තුළ පවා කිලිනොච්චි හි දෙමළ මාධ්‍යවේදියෙකුට කණ්ඩායමක් විසින් පහර දෙන ලදී.
www.dailymirror.lk


එය සාර්ථක ලෙස ක්‍රියාවට නැගීමට අසමත් වී ඇත.

ක්ෂේත්‍රයේ වෘත්තීය සහ (මාධ්‍යවේදීන්ගේ සහ මාධ්‍ය සේවකයින්ගේ) කම්කරු අයිතීන් සැලකිය යුතු ලෙස උල්ලංඝනය වන අතර එහි ප්‍රතිඵල ලෙස මාධ්‍යවේදීන්ගේ සහ මාධ්‍ය සේවකයින්ගේ වැඩ කරන තත්ත්වයන් පිරිහීමට ලක්ව ඇති බව නිරීක්ෂණය කළ හැකිය. උදාහරණයක් ලෙස වෘත්තීය සමිතියක් පිහිටුවීමේ හෝ සමිතියකට සම්බන්ධ වීමේ හෝ අයිතිය නීතිය මගින් පිළිගෙන සහ ආරක්ෂා කර තිබුණත් ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීන් හෝ මාධ්‍ය සේවකයන් එම අයිතිය භුක්ති විඳීම සඳහා දිරිමත් කිරීම සිදු වන බවක් නිරීක්ෂණය කළ නොහැක. පර්යේෂක විසින් නිරීක්ෂණය කළ ආකාරයට ඇතැම් මාධ්‍යවේදීන්ට ඒ සඳහා උනන්දුවක් නොමැත. ඇතැම් අවස්ථාවලදී මාධ්‍ය ආයතන විසින් විවිධාකාරයෙන් එම අයිතිය අවහිර කරනු ලැබ ඇත. එම අයිතිය දිනාගැනීම සඳහා සටන් කිරීමට ඇතැම් මාධ්‍යවේදීන්ට අවශ්‍යතාව පැවතියත් ඔවුන් සඳහන් කරන්නේ එය දැනට සිදු කරන රැකියාව අහිමි වීමට පමණක් නොව නව රැකියාවක් සොයාගැනීම සම්බන්ධයෙන් අහිතකර බලපෑමක් ඇති කිරීමටද හේතු විය හැකි බවයි. මෙහි අවසන් ප්‍රතිඵලය වී ඇත්තේ රටේ ජනතාවගේ කම්කරු ඇතුළු අයිතීන් පිළිබඳ හඬ නගන මාධ්‍ය සමාජය සිය වෘත්තීය අයිතිවාසිකම් බැහැර කොට ඇති බවකි.

කොවිඩ් 19 වසංගතය නිසා, වැටුප් කැපීම, සෞඛ්‍ය ප්‍රශ්න, සහ නිසි සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමේ හැකියාව නැති වීම වැනි ප්‍රශ්නවලට මුහුණ දීමට මාධ්‍යවේදීන්ට සහ මාධ්‍ය සේවකයින්ට සිදු විය. වඩාත් නිශ්චිතව කිවහොත්, තමන්ගේ සේවකයින් ආරක්ෂා කර ගැනීම සඳහා හොඳින් ස්ථාපනය කළ කොවිඩ් 19 ප්‍රතිචාර සැලසුමක් ශ්‍රී ලංකාවේ කිසිදු මාධ්‍ය ආයතනයක් ක්‍රියාත්මක කළ බවට සාක්ෂි නැත.

පර්යේෂකගේ නිරීක්ෂණ මගින් පෙන්නුම් කරන්නේ, මාධ්‍ය වෘත්තීයභාවය සහ මාධ්‍ය සමාජයේ වෘත්තීය අයිතිවාසිකම් සම්බන්ධ එබඳු ප්‍රශ්න, නිරීක්ෂකයින් සහ ඔවුන්ගේ දර්ශක මගින් මැන බැලීම දුලබ සහ දුර්වල බවයි.

ඉහත කී සොයා ගැනීම් අනුව පැහැදිලි වන්නේ, ප්‍රධාන වශයෙන් ව්‍යුහාත්මක ප්‍රශ්න, සහභාගීත්වය, විවිධත්වය සහ මාධ්‍ය නිෂ්පාදිතයේ ගුණාත්මක බව ඇතුළු ඇතැම් මාධ්‍ය නිදහසට අදාළ මාන ගැන නිරීක්ෂකයින් සහ ඔවුන්ගේ දර්ශක මගින් අවධානය යොමු කිරීම ප්‍රමාණවත් නැති බවයි. මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිත බව, නීතිමය තත්ත්වයන් සහ මාධ්‍යයේ ස්වාධීනත්වය සහ වෘත්තීයභාවය පිළිබඳ මානයන් නිරීක්ෂකයින් සහ ඔවුන්ගේ දර්ශක මගින් සාපේක්ෂ වශයෙන් සැලකිල්ලට ගෙන සහ මැන බලා ඇත. කෙසේ වෙතත්, මාධ්‍ය ස්වාධීනත්වය සහ වෘත්තීයභාවයට අදාළ මානයන් ඔස්සේ විහිදෙන සොයා බැලීම් තවත් වර්ධනය කළ යුතුය.




FB@PoliticalCartoonsLKA

# 5. වෙනත් සොයාගැනීම්



2020 ඔක්තෝබර් 13 දින නීතිවිරෝධී දැව ජාවාරම් හෙළිදරව් කළ මුලතිව් මාධ්‍යවේදීන් දෙදෙනෙකුට පහර දුන්හ. www.dailymirror.lk

2020 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස් තත්ත්වය විශ්ලේෂණය කිරීමේ දී, භූගෝලීය සහ ජන සංයුතියට සම්බන්ධ අංශවලින් අමතර දත්ත හමු විය. එම දත්ත සංක්ෂිප්ත ආකාරයෙන් පහතින් ඉදිරිපත් කොට සහ විශ්ලේෂණය කොට ඇත.

2020 දී ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසට සම්බන්ධ සිදුවීම් 58ක් පර්යේෂක විසින් ලැයිස්තු ගත කරනු ලැබ ඇති[68] අතර ක්‍රියාවේ ස්වභාවය නිසා සිදුවීම් 4ක ප්‍රදේශ සොයාගත නොහැකිය. කෙසේ වෙතත්, සිදුවීම් හෝ ප්‍රශ්න 54ක් පහත සඳහන් ලෙස දිස්ත්‍රික්ක 16කට බෙදා දැක්විය හැකිය.

**වගුව 03 - සිදුවීම් සංඛ්‍යාව - භූගෝලීය බෙදීයැම**


| දිස්ත්‍රික්කය | සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 22 |
| කළුතර | 01 |
| යාපනය | 09 |
| වවුනියාව | 01 |
| මුලතිව් | 02 |
| ත්‍රිකුණාමලය | 03 |

| දිස්ත්‍රික්කය | සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| මඩකලපුව | 06 |
| පුත්තලම | 02 |
| කුරුණෑගල | 01 |
| මහනුවර | 01 |
| නුවරඑළිය | 01 |
| බදුල්ල | 01 |
| මොනරාගල | 01 |
| රත්නපුර | 01 |
| කෑගල්ල | 01 |
| මාතර | 01 |
| එකතුව | 54 |

ඉහත වගුවට අනුව බස්නාහිර පළාතෙන් ප්‍රශ්නකාරී සිදුවීම් 23ක් (කොළඹ දික්කයෙන් 22ක් සහ කළුතරින් 01ක්) වාර්තා වී ඇති අතර උතුරු පළාතෙන් සිදුවීම් 12ක් (යාපනයෙන් 09ක්, මුලතිව්වලින් 02ක් සහ වවුනියාවෙන් 01ක්) වාර්තා වී ඇත. තව ද, නැගෙනහිර පළාතෙන් සිදුවීම් 09ක් (මඩකලපුවෙන් 06ක් සහ ත්‍රිකුණාමලයෙන් 03ක්) වාර්තා වී ඇත. ඒ අනුව බස්නාහිරින් බැහැරව සිදුවීම් හෝ ප්‍රශ්න වැඩි සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ පිළිවෙළින් උතුරු සහ නැගෙනහිර පළාත්වලින් බව පෙනී යයි.

වාර්ගික ආගමික දැක්මකින් වින්දිතයින් හඳුනාගැනීමේ උත්සාහයක් ද පර්යේෂක විසින් දරනු ලැබීය. ඒ අනුව, පිළිවෙළින් අවස්ථා 27ක දී සිංහල, 20ක දී දෙමළ සහ 03ක දී මුස්ලිම් ලෙස වින්දිතයන් හඳුනාගනු ලැබිණ. සිදුවීම්වල ස්ත්‍රී පුරුෂ දැක්ම ද හඳුනාගැනීමට පර්යේෂක උත්සාහ දැරීය. එවිට පෙනී ගියේ සිදුවීම් 7ක දී සිදුවීම්වලට මුහුණ පා ඇත්තේ ස්ත්‍රීන් වන අතර අවස්ථා තුනක දී ඔවුන් ප්‍රධාන වින්දිතයින් වී ඇති බවයි.[69]

ඊට අමතරව, රටේ මාධ්‍ය නිදහස පිළිබඳ ප්‍රශ්නයේ දී රජය සහ එහි කොටස්කරුවන් තීරණාත්මක කාර්යයක් කරන බව පර්යේෂකට සොයාගත හැකි විය. අංක 2 වගුවෙන් විස්තර කොට ඇති පරිදි, පොලිසිය සහ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් ඇතුළු රජයේ නිලධාරීන් මාධ්‍ය නිදහසට එරෙහි ප්‍රශ්න ගණනාවක් ඇති කොට තිබේ. තව ද, ප්‍රධාන වශයෙන් උතුරු සහ නැගෙනහිර පළාත්වල දී, මෙම දර්ශකයේ තීරණාත්මක කොටසක් හමුදා නිලධාරීන් විසින් ද ඉටු කොට ඇත. ඇතැම් දේශපාලන සහ ආගමික කණ්ඩායම් ද මාධ්‍ය නිදහසට එරෙහිව ක්‍රියා කරන බව නිරීක්ෂණය විය. අවස්ථා ගණනාවක දී, ප්‍රධාන වශයෙන් මාධ්‍යයේ ස්වාධීනත්වය, මාධ්‍යයේ ව්‍යුහය සහ වෘත්තීයභාවය උල්ලංඝනය කරමින්, මාධ්‍ය හිමිකරුවන් පමණක් නොව ඇතැම් මාධ්‍යවේදීන් ද මාධ්‍ය නිදහසට එරෙහිව ක්‍රියා කොට ඇති බව සදහන් කළ යුතුව තිබේ.



# 6. නිගමනය





ඝාතනයට හා විවිධාකාර පීඩාවන්ට පත් වූ මාධ්‍යවේදීන් හා මාධ්‍ය සේවකයින් සිහි කිරීම පිණිස, මාධ්‍ය සංවිධාන එකතුව විසින් 2020 ජනවාරි 28 දින ලිප්ටන් වටරවුමේ දී පවත්වන ලද පහන් දැල්වීමේ වැඩ සටහනේ එක් අවස්ථාවක්.
www.fmmsrilanka.lk

2020 වර්ෂයේ ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසේ තත්ත්වය යහපත් මට්ටමක නොතිබූ බව, ඉහත සොයා ගැනීම් මත පදනම් වූ විට ඉතාමත් පැහැදිලිය. ප්‍රධාන වශයෙන්, පටිගත කිරීමේ නිදහස, පුවත්පත් නිදහස, අන්තර්ජාල නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ඇතුළු මාධ්‍ය නිදහසේ සංරචක ගණනාවක් අහිතකර ලෙස බලපෑමට ලක් විය. ප්‍රකාශනයේ නිදහස සහ සිතීමේ නිදහස වැනි ඇතැම් සංරචක ඊට සාපේක්ෂ වශයෙන් අඩු බලපෑමකට ලක්ව ඇත. කෙසේ වෙතත්, සමස්තයක් ලෙස ගත් විට මාධ්‍ය නිදහසට ආදළව මෙම පර්යේෂණය තුළ දී සලකා බලනු ලැබූ සංරචක දහයම විවිධාකාර ලෙස විවිධ පරිමාවන්ගෙන් නිෂේධනාත්මක බලපෑමකට ලක්ව ඇති බව සඳහන් කළ හැකි වේ. එයින් පෙනී යන්නේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ ඉතාමත් තීරණාත්මක සාධකයක් වන ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස 2020 වර්ෂයේ අහිතකර තත්ත්වයක පැවති බවයි.

මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව, නීතිමය තත්ත්වයන් ඇතුළු මාන ඔස්සේ විහිදී ඇති මාධ්‍ය නිදහසට එරෙහි සිදුවීම් 2020 වර්ෂයේ දී සැලකිය යුතු තරම් ඉහළ මට්ටමක පැවතිණි. තවද, මාධ්‍යයේ ස්වාධීනත්වය සහ වෘත්තීයභාවය වැනි මානයන් හා සම්බන්ධ ප්‍රශ්න ද, වාර්තා විය. කෙසේ වෙතත්, ව්‍යුහාත්මක, සහභාගීත්ව සහ මාධ්‍ය නිෂ්පාදිතයේ විවිධත්වය සහ ගුණය ආදී මානයන් ඔස්සේ විහිදුණු සිදුවීම් නිරීක්ෂකයන් විසින් වාර්තා කර නැත. කෙසේ වෙතත්, අඩුවෙන් වාර්තා වීම හෝ වාර්තා නොවීම හෝ මාධ්‍ය නිරීක්ෂකයින් සහ ඔවුන්ගේ දර්ශක පිළිබඳ ප්‍රශ්නයක් බව සටහන් කළ යුතුය. වෙනත් ආකාරයකින් කිවහොත්, ව්‍යුහාත්මක, සහභාගීත්ව සහ මාධ්‍ය නිෂ්පාදිතයේ විවිධත්වය සහ ගුණය ආදී මානයන් ඔස්සේ විහිදුණු ප්‍රශ්න ගණනාවක් ඇතත්, ඒවා නිවැරදි ලෙස සොයා ගැනීමට නිරීක්ෂකයින්ට සහ ඔවුන්ගේ දැනට ඇති දර්ශකවලට හැකියාවක් ලැබී නැත.

මෙම පසුබිම යටතේ, පර්යේෂකගේ යෝජනාව වන්නේ, මාධ්‍ය නිදහසේ තත්ත්වය තේරුම් ගැනීම සඳහාත් මාධ්‍ය නිදහසට එරෙහි වීම ගැන වඩාත් නිවැරදිව

කටයුතු කිරීම සඳහාත් මාධ්‍ය නිරීක්ෂකයින් තමන්ගේ නිරීක්ෂණ ක්‍රියාවලිය සහ දර්ශක සංශෝධනය කළ යුතු බවයි. තව ද, පර්යේෂකගේ නිරීක්ෂණය වන්නේ, මාධ්‍ය නිදහස් නිරීක්ෂණ ක්‍රියාවලිය, වර්ගීකරණ සහ ව්‍යුහාත්මක ප්‍රවේශයක් වනවා වෙනුවට සිදුවීම් පදනම් කර ගත්තක් වී ඇති බවයි. එම නිසා, ඉදිරි වසරවල මාධ්‍ය නිදහස් තත්ත්වය තේරුම් ගැනීම සඳහා වඩාත් සුදුසු වන්නේ "වර්ගීකරණ සහ දර්ශක පදනම් ප්‍රවේශයක්" අනුගමනය කිරීමය යන්න පර්යේෂක යෝජනා කරයි. මේ සඳහා මේ වනවිට විවිධ අන්තර්ජාතික සංවිධාන විසින් භාවිත කරන දර්ශකත් මෙහිදී පර්යේෂක විසින් පෙන්වා දී ඇති අවම අනාවරණයක් සහිත මාන ආවරණය වන පරිදි සකසා ගත් නව දර්ශකත් එක්කොට ශ්‍රී ලංකාවට ආදාළ මාධ්‍ය නිදහස තක්සේරු කර කිරීමේ නව දර්ශක පද්ධතියක් සකසා ගැනීම වඩාත් යෝග්‍ය වේ.



www.themorning.lk


## මූලාශ්‍ර

1 Norris Pippa, The Role of the Free Press in Promoting Democratization, Good Governance and Human Development, 2008.

2 https://en.unesco.org/themes/press-freedom-all-platforms (Last access, 15/02/2021)

3 https://www.britannica.com/topic/media-freedom (Last access, 15/02/2021)

4 http://www.unesco.org/new/en/unesco/events/prizes-and-celebrations/celebrations/international-days/world-press-freedom-day/previous-celebrations/worldpressfreedomday20090000/freedom-of-information-and-the-press/ (Last accessed, 15/02/2021)

5 Pearson Mark, Press freedom, social media and the citizen, Pacific Journalism Review, 2013, P 215-227

6 Schneider Laura, Measuring Global Media Freedom, The Media Freedom Analyzer as a New Assessment Tool, Springer VS, 2020, Page 06

7 Cinque Toija, Media and Society, What Is the Media, and Is Digital Media 'New'?, http://lib.oup.com.au/he/samples/chalkley_CDMEL2e_sample.pdf (Last accessed, 15/02/2021)

8 Ugland Erik, Henderson Jennifer, Who Is a Journalist and Why Does it Matter? Disentangling the Legal and Ethical Arguments, Journal of Mass Media Ethics, Vol. 22, No. 4, 2007, 241-261

9 Article 14 (1) (a) of 1978 Constitution says Every Citizen has entitled to the freedom of speech and expression including publication…

10 Act No 12 of 2016

11 Supreme Court of Sri Lanka recognized right to receive information under the umbrella of freedom of speech of expression even before 20 years to enact the Right to Information Act by Fernando v The Sri Lanka Broadcasting Corporation (1996) 1 Sri LR 157

12 Ranjanee Seetha, Martyrs of the Freedom of Expression in Sri Lanka, Free Media Movement, 2011, P 11-17

13 http://www.jdslanka.org/index.php/killed-media-workers (Last accessed, 15/02/2021)

14 Impunity on crimes against journalists, Basic report prepared by FMM Sri Lanka in 2019

15 Impunity Report from 2000-2015, Free Media Movement, 2019

16 https://freedomhouse.org/report/freedom-press/2017/sri-lanka

17 https://rsf.org/en/ranking (Last accessed, 15/02/2021)

18 There is no core data base on number of journalists in Sri Lanka. Therefore, researcher estimated the figure with the some documents, and studies by Government Information Department and some media organizations of the country.

19 MediaLK.com/IMS (2020), Performance of Sri Lanka's Mass Media Industry 2015-2019: A Data Driven Analysis, Colombo, MediaLk.com/IMS, 2020

20 Free Media Movement, Digital Media Survey, 2019

21 Bublitz Christoph, Freedom of thought in the age of neuroscience, Archives for Philosophy of Law and Social Philosophy, January 2014

22 Article 10, Every person is entitled to freedom of thought, conscience and religion

23 See number 07 of the Annexure 01

24 Article 19 (1) of International Covenant on Civil and Political Rights

25 Article 10, Freedom of thought, conscience and religion, Article 14, Freedom of speech, assembly, association, occupation, movement

26 See No 09 and 13 of

27 Interviews of some journalists of Sri Lanka Rupawahini Corporation and Sri Lanka Broadcasting Corporation

28 Article 14 describes the right to Freedom of speech, and Article 14 (2) and Article 15 (2) mentions about reasonable restrictions.

29 See Number 15 of the Annexure 01

30 See Number 17 of the Annexure 01

31 Mendal Toby, Restricting Freedom of Expression: Standards and Principles, Center for law and Democracy, http://www.law-democracy.org/wp-content/uploads/2010/07/10.03.Paper-on-Restrictions-on-FOE.pdf (Last accessed, 15/02/2021)

32 Researcher interviews some Radio and TV journalists in January 2021

33 https://www.law.cornell.edu/constitution-conan/amendment-1/freedom-of-expression-is-there-a-difference-between-speech-and-press (Last accessed, 15/02/2021)

34 See Number 21 of the Annexure 01

35 Article 19 (2) of the International Covenant on Civil and Political Rights

36 Right to Information Act No 12 of 2016

37 See Number 42 of the Annexure 01

38 See Number 46 of the Annexure 01

39 Interview with some of j

40 https://www.slpi.lk/20th-amendment-and-the-right-to-information/ (Last accessed, 16/02/2021)

41 Supra Note 06

42 See Number 02, 50 of the Annexure 01

43 See Number 48, 45 of the Annexure 01

44 See Number 04, 47 of the Annexure 01

45 See Number 16 ,22 of the Annexure 01

46 See Number 25of the Annexure 01

47 The researcher observes several incidents and as a result of such recording issues government issued specific guidelines over Covid reporting.

48 Group of people including Buddhist monks made a complaint against the book in August.

49 http://www.ft.lk/news/Arrest-of-Mannar-poet-under-PTA-Academics-writers-and-activists-cry-foul/56-711244 (Last accessed, 16/02/2021)

50 https://constitution.congress.gov/constitution/amendment-1/ (Last accessed, 16/02/2021)

51 Supra Note 06

52 See Number 03 of Annexure 01

53 See Annexure 01

54 The researcher interviewed group of print journalists in the month of January 2021

55 Access to the Air Waves, Principles on Freedom of Expression and Broadcast Regulation, Article 19, London, 2002

56 Secretariat for Media Reforms (2016), Rebuilding Public Trust: An Assessment of the Media Industry and Profession in Sri Lanka. Colombo: SMR/IMS

57 See Number 20 of the Annexure 01

58 https://internews.org/news/internet-freedom-basic-human-right (Last accessed, 15/02/2021)

59 https://lirneasia.net/wp-content/uploads/2010/08/FOE_and_Internet_in_Sri_Lanka.pdf (Last accessed 15/02/2021)

60 See Number 15 of the Annexure 01

61 See Number 28 of the Annexure 01

62 See Number 29 of the Annexure 01

63 See Number 57 of the Annexure 01

64 See Number 15 of the Annexure 01

65 See Annexure 01

66 Figures of FMM, SLWJA and FMETU

67 See the Annexure 01

68 See Annexure 01

69 https://www.tamilguardian.com/content/sri-lankan-police-threaten-family-tamil-guardian-correspondent-arrest-warrant, (Last accessed, 04/02/2021)

# ඇමුණුම 01

## 2020 වර්ෂයේ ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසට අදාළ සිදුවීම්

| සිදුවීම/ක්‍රියාව/දිස්ත්‍රික්කය | දිනය/මාසය | විස්තරය සහ අදහස් | වර්ගය සහ ස්වභාවය |
|---|---|---|---|
| මාධ්‍යවේදියකුගේ නිවෙසට පොලිසිය ඇතුළු වීම - මඩකලපුව | ජනවාරි 02 | මඩකලපුවේ එස් නිලන්තන් මාධ්‍යවේදියාගේ නිවසට ඇතුළු වූ සාමාන්‍ය ඇඳුමින් සැරසුණු පොලිස් නිලධාරීන් ඔහුගේ පවුලේ අයට තර්ජනය කිරීම[1] | අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස / මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව, පොලිසියෙන් තර්ජන කිරීම |
| ඉරණතිව් දූපතට ඇතුළු වීමට විදේශීය මාධ්‍යවේදියකුට ඉඩ නොදීම - යාපනය | ජනවාරි 05 | වලංගු ජනමාධ්‍යවේදී වීසා සහ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ මාධ්‍ය හැඳුනුම්පත ඇතිව සිටි විදේශීය මාධ්‍යවේදියකුට ඉරණතිව් දූපතට ඇතුළු වීමට නාවික හමුදාව ඉඩ නොදෙයි[2] | පටිගත කිරීමේ අයිතිය / නීතිමය තත්ත්වයන්, ප්‍රවේශයට ඉඩ නොදීම |
| ජනමාධ්‍යවේදිනියක් ඉදිරිපත් කළ පැමිණිල්ල භාරගැනීම පොලිසිය ප්‍රතික්ෂේප කිරීම - කොළඹ | ජනවාරි 10 | මරණීය තර්ජනයට ලක් වූ, ලංකාදීප උසාවි වර්තාකාරිනියක වන නිමන්ති රණසිංහ වෘත්තීය මාධ්‍යවේදිනියට එරෙහිව මාලිගාවත්ත පොලිසියේ ස්ථානාධිපති කළ පහත් කොට සැලකීම[3] | පුවත්පත් නිදහස / නීතිමය තත්ත්වයන්, පොලිසියේ නොතකා හැරීම්, මරණීය තර්ජන |
| මාධ්‍යවේදියකුට පහර දී අඩන්තේට්ටම් කිරීම - පුත්තලම | ජනවාරි 17 | වෙන්නප්පුවේ කුඹුරක් අනවසරයෙන් ගොඩ කිරීම හෙළිදරව් කිරීමෙන් පසුව, හලාවත මාධ්‍යවේදියකු වන ප්‍රසාද් පූර්ණමාල් ජයමාන්නට, දේශපාලඥයින් කිහිප දෙනෙකුට සම්බන්ධ කණ්ඩායමක් විසින් පහර දී අඩන්තේට්ටම් කිරීම.[4] | පටිගතකිරීමේ නිදහස / මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව, පහර දී අඩන්තේට්ටම් කිරීම |
| මාධ්‍යවේදියකුගේ පෞද්ගලික තොරතුරු ඉල්ලා සිටීම - මඩකලපුව | ජනවාරි 18 | මඩකලපුවේ මාධ්‍යවේදියකුගේ නිවෙසට ගිය ග්‍රාම නිලධාරීවරයා ඔහුට ප්‍රකාශ කළේ කොළඹ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඔහුගේ පෞද්ගලික තොරතුරු ඉල්ලා ඇති බවයි.[5] | අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස / නිලධාරියකු විසින් පෞද්ගලික තොරතුරු ඉල්ලා සිටීම |
| මාධ්‍යවේදියකුගේ නිවසට පහරදීම - යාපනය | ජනවාරි 19 | යාපනයේ, මානිපෙයිහි දෙමළ ප්‍රාදේශීය ප්‍රවෘත්ති මාධ්‍යවේදියකුගේ නිවෙසට හඳුනා නොගත් කණ්ඩායමක් පහර දී ඇත.[6] | අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස / පුවත්පත් නිදහස, මාධ්‍යවේදියකුගේ ආරක්ෂාව, පහරදීම |
| මාධ්‍යවේදියකු, ඔහුගේ ජනවර්ගය පදනම්ව වෛරී ප්‍රකාශවලට මුහුණදීම - කොළඹ | ජනවාරි 20 | හිටපු ඇමති රන්ජන් රාමනායක සහ මාධ්‍යවේදී අසාම් අමීන් අතර පටිගත කළ සංවාදයක් අන්තර්ජාලයට මුදා හැරීමෙන් පසු ඔහුගේ වාර්ගිකත්වය හා ආගමික විශ්වාසය මත පදනම් වූ වෛරී ප්‍රකාශවලට මුහුණ දීමට මාධ්‍යවේදී අසාම් අමීන්ට සිදු විය.[7] | සිතීමේ නිදහස, මත දැරීමේ නිදහස / සංවිධානාත්මක වෛරී ප්‍රකාශ |

| සිදුවීම/ක්‍රියාව/දිස්ත්‍රික්කය | දිනය/මාසය | විස්තරය සහ අදහස් | වර්ගය සහ ස්වභාවය |
|---|---|---|---|
| දෙමළ මාධ්‍යවේදීන් 7 දෙනෙකු මරණීය තර්ජනවලට ලක් වීම - ජනවාරි 23 | ජනවාරි 23 | ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ නගරයක් වන මඩකලපුවේ දෙමළ මාධ්‍යවේදීන් හත් දෙනෙකු මරා දමන බවට තර්ජනය කළ පත්‍රිකා මඩකලපුව මාධ්‍ය සමාජයේ කාර්යාලයට සහ අසල බස් නැවතුමේ දමා ගොස් තිබීම.[8] | අදහස් ප්‍රකාශකිරීමේ නිදහස / මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව, මරණීය තර්ජන. |
| මාධ්‍යවේදීන්ට එරෙහිව පදනම් විරහිත පැමිණිලි දැමීම - කොළඹ | පෙබරවාරි 03 | ලේක් හවුස් (රජයට අයත් මාධ්‍ය ආයතනයකි) ආයතනයේ ආණ්ඩුවට හිතවත් වෘත්තීය සමිතියක් වූ වාණිජ සහ කාර්මික සේවා ප්‍රගතිශීලී කම්කරු සමිතිය, එම ආයතනයේ ම ඇතැම් මාධ්‍යවේදීන්ට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කළේය. ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයේ සේවකයින් සමග . සහ වර්තමාන ජනාධිපතිවරයාගේ පුරවැසිභාවය පදනම් කරගෙන ඔහුගේ ජනාධිපති අපේක්ෂකත්වය ප්‍රශ්න කරමින් නඩුවක් පවරනු ලැබූ සිවිල් සමාජ ක්‍රියාකාරිකයන් දෙදෙනා සමග එම මාධ්‍යවේදීන්ගේ සබඳතා පරීක්ෂා කරන ලෙස එම පැමිණිල්ලෙන් ඉල්ලා තිබිණි ගොනු කොට තිබිණි.[9] | මත දැරීමේ නිදහස / මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව, මූලාශ්‍ර ආරක්ෂා කිරීම, අනියම් තර්ජනය |
| මාධ්‍යවේදියකුගේ වෘත්තීය වගකීම් ඉටු කිරීමට එරෙහිව බාධා කිරීම - ත්‍රිකුණාමලය | පෙබරවාරි 04 | කන්තලේ 87 වැනි වංගුවේ සිදු වූ බස් අනතුරක් වාර්තා කිරීමට ගිය මාධ්‍යවේදී රොෂාන් කුමාරට ඔහුගේ වෘත්තීය වගකීම් ඉටු කිරීමට බසයේ හිමිකරු වූ ත්‍රිකුණාමලයේ දේශපාලනඥයකුගේ පුත්‍රයකු විසින් බාධා කරනු ලැබීය.[10] | පටිගත කිරීමේ අයිතිය / බාධා කිරීම සහ බියගැන්වීම. |
| මාධ්‍යවේදිනියකගෙන් පොලිසිය ප්‍රශ්න කිරීම - කොළඹ | පෙබරවාරි 10 | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සන්ඩේ ටයිම්ස් මාධ්‍යවේදිනී අනුරන්ගී සිංගෙන් කට උත්තරයක් ලබා ගත්තේය. උසාවියේ මූලාශ්‍ර අනුව, ඇයගෙන් ප්‍රශ්න කරන ලද්දේ සන්ඩේ ඔබ්සර්වර් හිටපු කර්තෘ දරිෂා බැස්ටියන් සහ ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලීය කාර්ය මණ්ඩලය සම්බන්ධ සිදුවීමට තිබිය හැකි සම්බන්ධතා පිළිබඳවය.[11] | පුවත්පත් නිදහස / ඇගේ සම්බන්ධතා සහ මූලාශ්‍ර පිළිබඳව මාධ්‍යවේදිනියකගෙන් පොලිසිය ප්‍රශ්න කිරීම. |
| මාධ්‍යවේදීන් කණ්ඩායමක් තර්ජනයට ලක්වීම - කොළඹ | පෙබරවාරි 18 | ස්ත්‍රීන්ට එරෙහිව වෙනස් කොට සැලකීමේ ප්‍රකාශ කළ බෞද්ධ භික්ෂුවක් විවේචනය කරමින් ලිපියක් පළ කිරීම ගැන තමන්ගේ වෙබ් අඩවියට සම්බන්ධ මාධ්‍යවේදීන්ට දුරකථන මගින් තර්ජන එල්ල වූ බව ජනයුගය ඩොට් එල්.කේ. වෙබ් අඩවිය ප්‍රකාශ කළේය.[12] | අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස / තර්ජනය කිරීම |
| ඇතැම් මාධ්‍යවේදීන්ට, ඔවුන්ගේ දේශපාලන මතය නිසා වෙනස් කොට සැලකීම. | පෙබරවාරි 20 දාට ආසන්නව | ලේක් හවුස් ආයතනයේ එක්සත් ජාතික පක්ෂයේ සහාය ලබන වෘත්තීය සමිතිය වන ජාතික සේවක සංගමයේ සාමාජිකයින් වූ ඇතැම් මාධ්‍යවේදීන් ඔවුන්ගේ වැටුප් වර්ධක සම්බන්ධයෙන් තෝරාගෙන වෙනස් කොට සැලකීම.[13] | මත දැරීමේ නිදහස / වෙනස් කොට සැලකීම |

| සිදුවීම/ක්‍රියාව/දිස්ත්‍රික්කය | දිනය/මාසය | විස්තරය සහ අදහස් | වර්ගය සහ ස්වභාවය |
|---|---|---|---|
| මාධ්‍ය වෘත්තිකයින් පිරිසක් පොලිසිය විසින් කැඳවනු ලැබීම - වවුනියාව | මාර්තු 02 | වවුනියාවේ පදනම් වූ දෙමළ භාෂාවෙන් පළ වන පුවත්පතක් වූ තිනපුවල්හි අධ්‍යක්ෂ ශක්තිවෙල්පිල්ලේ ප්‍රකාශ්, ඔහුගේ බිරිඳ සහ තවත් කර්තෘවරයකු ශ්‍රී ලංකා ත්‍රස්තවාදී විමර්ශන දෙපාර්තමේන්තුව විසින් කැඳවනු ලැබීය.[14] | පුවත්පත් නිදහස, මත දැරීමේ නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස / වක්‍ර ලෙස තර්ජනය කිරීම |
| ව්‍යාජ ප්‍රවෘත්ති ප්‍රචාරය ගැන ඇතැම් සමාජ මාධ්‍ය භාවිත කරන්නන් අත්අඩංගුවට ගැනීම සඳහා පොලිස් පරීක්ෂණයක් ආරම්භ කිරීම. | මාර්තු 17 | කොරෝනා වසංගතය සහ නිරෝධායන ක්‍රියාවලිය සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය තුළින් ව්‍යාජ ප්‍රවෘත්ති පළ කිරීම සම්බන්ධයෙන් සැකකරුවන් 40ක් පමණ අත් අඩංගුවට ගැනීමට තමන් පරීක්ෂණයක් ආරම්භ කළ බව පොලිසිය ප්‍රකාශ කළේය.[15] | කතා කිරීමේ නිදහස / පොලිසිය මගින් අත් අඩංගුවට ගැනීම. |
| මාධ්‍යවේදියකුට තර්ජනය කොට ඔහුගේ උපකරණ පැහැර ගැනීම - බදුල්ල | මාර්තු 28 | කොවිඩ් 19 ඇඳිරි නීතිය උල්ලංඝනය කරමින් වෙළෙඳ සැල් විවෘත කොට තැබීම වාර්තා කිරීම නිසා සූර්යන් එෆ්.එම්. හපුතලේ ප්‍රාදේශීය මාධ්‍යවේදී පී මහේස්වරන්ට මරණීය තර්ජන සිදුකොට ඔහුගේ උපකරණ පැහැර ගනු ලැබීය. සැකකරු පොලිසිය විසින් අත් අඩංගුවට ගනු ලැබීය.[16] | පටිගත කිරීමේ අයිතිය / මාධ්‍යවේදියකුගේ ආරක්ෂාව, තර්ජනය |
| සනාථ නොකළ පුවතක් පළ කළේ යයි චෝදනා කරමින් වෙබ් මාධ්‍යවේදියකු සහ වෛද්‍යවරයකු අත් අඩංගුවට ගැනීම - කුරුණෑගල සහ කොළඹ | මාර්තු 29 | පෞද්ගලික රෝහලක සිටි කොවිඩ් 19 යයි සැක රෝගියකු පිළිබඳව සනාථ නොකළ ප්‍රවෘත්තියක් පළ කළේ යැයි චෝදනා කරමින් වෙබ් මාධ්‍යවේදී නුවන් නිරෝෂන් අල්විස් අත් අඩංගුවට ගැනිණි. තව ද, තොරතුරු හෙළි කිරීම සම්බන්ධයෙන් පෞද්ගලික රෝහලක වෛද්‍යවරයකු ද අත් අඩංගුවට ගනු ලැබීය. දෙදෙනා ම සති දෙකකට රක්ෂිත බන්ධනාගාර ගත කෙරිණි.[17] | කතාකිරීමේ නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස / අත් අඩංගුවට ගැනීම සහ සිරගත කිරීම. |
| මාධ්‍යවේදියකුට පහරදීම - යාපනය | මාර්තු 31 | කිලිනොච්චියේ ඔහුගේ කාර්යාලයේ දී නොදන්නා පුද්ගල කණ්ඩායමක් දෙමළ මාධ්‍යවේදී නඩරාසලිංගම් තුෂාන්ත්ට කඩුවකින් පහර දීම.[18] | පුවත්පත් නිදහස / මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව, පහරදීම. |
| සමාජ මාධ්‍ය ලේඛකයකු ඔහුගේ ලිපියක් නිසා අත් අඩංගුවට ගැනීම - මහනුවර | අප්‍රේල් 09 | ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් ඉලක්ක කර ගත් වර්ගවාදය විවේචනය කරමින් සමාජ මාධ්‍යයේ ලිපියක් පළ කිරීම නිසා ප්‍රසිද්ධ සමාජ මාධ්‍ය ලේඛක රම්සි රසීක් මහනුවර ඔහුගේ නිවසේ දී අත් අඩංගුවට ගනු ලැබීය. "පෑන සහ යතුරු පුවරුව යොදාගත් මතවාදී ජිහාඩ් සටනක්" අවශ්‍ය බව ඔහු තම ලිපියේ සඳහන් කොට ඇත. කෙසේ වෙතත්, මරණ තර්ජන නිසා පසුදාම එම ලිපිය ඉවත් කළ අතර එම තර්ජන ගැන පොලිසියට පැමිණිලි කළේය.[19] | කතා කිරීමේ නිදහස / පොලිසිය මගින් අත් අඩංගුවට ගැනීම. |

| සිදුවීම/ක්‍රියාව/දිස්ත්‍රික්කය | දිනය/මාසය | විස්තරය සහ අදහස් | වර්ගය සහ ස්වභාවය |
|---|---|---|---|
| මාධ්‍යවේදීන් දෙදෙනෙකුගේ සහ මාධ්‍ය සේවකයින් දෙදෙනෙකුගේ සේවය අවසන් කිරීම - කොළඹ | අප්‍රේල් | මාධ්‍යවේදිනියක් ඇතුළු මාධ්‍යවේදීන් දෙදෙනකුගේත් මාධ්‍ය සේවකයින් දෙදෙනෙකුගේත්, වෙස් ගැන්වීම් ශිල්පියෙකුගේත් සේවය අවසන් කිරීමට ප්‍රධාන පෞද්ගලික මාධ්‍ය ආයතනයක් කටයුතු කළේය. වින්දිතයින්ට අනුව මෙම සේවය අවසන් කිරීම සිදුවුයේ, කොවිඩ් 19 නීතිවලට එරෙහිව ආයතනය විසින් සංවිධානය කරනු ලැබූ අලුත් අවුරුදු සැමරුමක් පිළිබඳ තොරතුරු හෙළිදරවු කළේය යන සැකය මතය. කෙසේ වෙතත්, සේවය අවසන් කිරීමේ ලිපිවල සඳහන් වුයේ ඔවුන්ගේ කාර්ය සාධනය ගැන ආයතනය තෘප්තිමත් නොවන බවයි.[20] | මත දැරීමේ නිදහස, කතා කිරීමේ නිදහස / මාධ්‍ය සේවක අයිතීන්, සේවය අවසන් කිරීම. |
| ඇතැම් මාධ්‍යවේදීන්ට එරෙහිව වෛරී ප්‍රචාරක ව්‍යාපාරයක් - මඩකලපුව | අප්‍රේල් | කොවිඩ් ඇඳිරි නීති කාලය තුළ සහනාධාර බෙදාදීමේදී සිදු වූ අසාධාරණයන් පිළිබඳ ඔවුන්ගේ වාර්තාකරණය හේතුවෙන් මඩකලපුවේ ඇතැම් මාධ්‍යවේදීන් පුද්ගලිකව ඉලක්ක කොට වෛරී ලිපි සහ කොමෙන්ටු සමාජ මාධ්‍යයේ පළ කරනු ලැබීය. වින්දිතයන්ට අනුව මෙම සංවිධානාත්මක වෛරී ප්‍රචාරක ව්‍යාපාරය මෙහෙයවන ලද්දේ ඇතැම් දේශපාලඥයින්, ඔවුන්ගේ ආධාරකරුවන් සහ ඇතැම් නිලධාරීන් විසිනි.[21] | අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස / මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව, වෛරී ප්‍රචාරක ව්‍යාපාර |
| මාධ්‍යවේදියකුට මරණ තර්ජන එල්ලවීම - නුවරඑළිය | මැයි 06 | කොවිඩ් සහනාධාර බෙදීමේදී සිදු වූ අසාධාරණයකම් සම්බන්ධයෙන් වර්තා කිරීම නිසා නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ටැමිල් මිරර්හි මාධ්‍යවේදී එස්. සතිෂ් කුමාර්ට දුරකතනයෙන් අමතා මරණීය තර්ජන එල්ල කළේය. | පුවත්පත් නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස / මරණීය තර්ජන එල්ල කිරීම. |
| මුහුණු පොතේ පොස්ටුවක් පළ කිරීම මත දෙදෙනෙකු අත් අඩංගුවට ගැනීම - කොළඹ | මැයි 06 | මෝදර වෙන්කටේශ්වර හින්දු කෝවිලේ තාවකාලිකව රඳවා සිටින පිරිසකට ආහාර සහ පානීය ජලය නොලැබෙන බව කියමින් මුහුණු පොතෙහි පෝස්ටුවක් පළ කිරීම ගැන දෙදෙනෙකු අත් අඩංගුවට ගනු ලැබීය. පොලිසිය ප්‍රකාශ කළේ ව්‍යාජ ප්‍රවෘත්ති පළ කිරීම සම්බන්ධයෙන් ඔවුන් අත් අඩංගුවට ගත් බවයි.[22] | කතා කිරීමේ නිදහස / පොලිසිය මගින් අත් අඩංගුවට ගැනීම. |
| මාධ්‍ය ආයතනයක වෙබ් අඩවියක් සයිබර් ප්‍රහාරයකට ලක්වීම | මැයි 17 | හිරු මාධ්‍ය සමාගමේ වෙබ් අඩවිය ටැමිල් ඊලාම් සයිබර් ෆෝර්ස් නමින් හඳුනාගනු ලැබූ කණ්ඩායමක් ක්‍රියාත්මක කළ සයිබර් ප්‍රහාරයකට ලක් වීම.[23] | අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස / සයිබර් ප්‍රහාර |
| ප්‍රාදේශීය මාධ්‍යවේදියකුගේ වැඩ කටයුතුවලට බාධා කිරීම සහ ඔහු බිය ගැන්වීම - කළුතර | මැයි 24 | රූපවාහිනී නාලිකා ගණනාවක ප්‍රාදේශීය මාධ්‍යවේදියකු වන බිමල් ශ්‍යාමන්, අටළුගම රාමදාන් සැමරුම වාර්තා කරන අතර බිය ගැන්වීමට සහ හිරිහැරවලට ලක් විය.[24] | පටිගතකිරීමේ නිදහස / බාධා කිරීම සහ බිය ගැන්වීම. |

| සිදුවීම/ක්‍රියාව/දිස්ත්‍රික්කය | දිනය/මාසය | විස්තරය සහ අදහස් | වර්ගය සහ ස්වභාවය |
|---|---|---|---|
| මාධ්‍යවේදිනියකගේ පරිගණකය උදුරා ගැනීමට තැත් කිරීම | මැයි 29 | දරිෂා බැස්ටියන් මාධ්‍යවේදිනියගේ කොළඹ නිවෙසට ගිය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඇගේ පෞද්ගලික ලැප් ටොප් පරිගණකය පැහැර ගැනීමට උත්සාහ දැරීය[25] | පුවත්පත් නිදහස / පරිගණකයක් පැහැර ගැනීමට පොලිසිය උත්සාහ දැරීම. |
| මියගිය මාධ්‍යවේදී අයියතුරෙයි නඩේසන් සමරු උත්සවයට පොලිසිය කළ බිය ගැන්වීම - යාපනය | මැයි 31 | මියගිය දෙමළ මාධ්‍යවේදී අයියතුරෙයි නඩේසන් (2004 දී ඝාතනයට ලක්වුවෙකි) පිළිබඳව යාපනයේ පුවත්පත් සමාජය සංවිධානය කළ සමරු උත්සවය පොලිසියේ පරීක්ෂා කිරීම් සහ බිය ගැන්වීම්වලට ලක් විය.[26] | මත දැරීමේ නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස / පොලිසිය මගින් බියගැන්වීම |
| වෙබ් අඩවියක් අවහිර කිරීම | ජුනි | සන්කති 24 ඩොට් කොම් දෙමළ මාධ්‍ය වෙබ් අඩවියට ප්‍රවේශ වීම බලධාරීන් විසින් අවහිර කරනු ලැබූ බව වාර්තා විය.[27] | අන්තර්ජාල නිදහස / වෙබ් අඩවියක් අවහිර කිරීම. |
| මාධ්‍යවේදියකු භාවිත කළ ලැප් ටොප් පරිගණකයක් පොලිසය සන්තකයට ගැනීම පැහැර ගැනීම - කොළඹ | ජුනි 09 | විදේශ ගත වූ මාධ්‍යවේදිනී දරිෂා බැස්ටියන් භාවිතා කළ ලැප් ටොප් පරිගණකය උසාවි නියෝගයක් මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිය භාරයට ගනු ලැබීය. වින්දිතයා නිකුත් කළ නිවේදනයකට අනුව මුළු නිවසම පරීක්ෂා කළ පොලිසිය ඡායාරූප ගෙන ඇත.[28] | පුවත්පත් නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස / පොලිසිය විසින් පරිගණකයක් පැහැර ගනු ලැබීම. |
| මාධ්‍යවේදීන් දෙදෙනෙකුට එරෙහිව මරණ තර්ජන - කොළඹ | ජුලි 02 | අරුණ පුවත්පතේ මාධ්‍යවේදීන් දෙදෙනකු වන තිස්ස රවීන්ද්‍ර පෙරේරා සහ හේමන්ත ලියනගේ දෙදෙනාට දුරකථන මගින් මරණීය තර්ජන එල්ල වුයේ පාතාල ලෝකය ගැන තොරතුරු වාර්තා කිරීම හේතුවෙනි | පුවත්පත් නිදහස / මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව, පාතාල ලෝකයෙන් මරණ තර්ජන එල්ල වීම. |
| ප්‍රවේශයට ඉඩ නොදීම සහ මාධ්‍යවේදියකුට තර්ජනය කිරීම - කොළඹ | ජුලි 03 | පොලිසිය විසින් සංවිධානය කොට තිබූ උත්සවයක් වාර්තා කිරීමට මාධ්‍යවේදියාට ඉඩ නොදෙන ලදි. නීතිපතිගේ නිල සම්බන්ධීකාරක මාධ්‍යවේදියාට ආරාධනා කොට තිබිණි. කෙසේවෙතත්, පොලිසිය ප්‍රවේශයට ඉඩ දී නැති අතර මාධ්‍යවේදියා එම ස්ථානයෙන් පිට වන විට ඔහුට තර්ජනය කොට ඇත.[29] | පටිගත කිරීමේ නිදහස, පුවත්පත් නිදහස / ප්‍රවේශයට ඉඩ නොදීම, පොලිසිය විසින් තර්ජනය කරනු ලැබීම. |
| පොලිසිය විසින් මාධ්‍යවේදියකු කැඳවනු ලැබීම - මුලතිව් | ජුලි 08 | වන සංරක්ෂණ නිලධාරීන් සාමාන්‍ය වැසියන් පිරිසකට පහර දී අඩන්තේට්ටම් කිරීමේ සිදුවීමක් වාර්තා කිරීම ගැන ටැමිල් ගාඩියන්හි මුලතිව් වාර්තාකරු ෂන්මුගම් තවශීලන් පොලිසියට කැඳවනු ලැබීය.[30] | පුවත්පත් නිදහස / පොලිසියට කැඳවනු ලැබීම. |
| මාධ්‍යවේදියකුට අවහිර කොට තර්ජනය කිරීම - කොළඹ | ජුලි 10 | කොළඹ මහාධිකරණ සංකීර්ණයේ දී පොලිස් නිලධාරී නියෝමාල් රංගජීව විසින් මව්බිම සහ සිලෝන් ටුඩේ ඡායාරූප මාධ්‍යවේදියාට අවහිර කොට තර්ජනය කරනු ලැබීය. රංගජීව යනු 2012 වැලිකඩ සිර ගෙදර රැඳවියන් ඝාතනය සම්බන්ධ ප්‍රධාන සැකකරුවෙකි.[31] | පටිගත කිරීමේ නිදහස / අවහිර කිරීම/තර්ජනය |
| මාධ්‍යවේදියකුගෙන් ප්‍රශ්න කිරීම - කොළඹ | ජුලි 14 | සන්ඩේ ලීඩර් කර්තෘ ලසන්ත වික්‍රමතුංග 2009 දී ඝාතනය කිරීම සම්බන්ධයෙන් 2017 දී ඔහු පළ කළ ලිපියක් ගැන පොලිස් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඊතලය සඟරාවේ කර්තෘ ශ්‍රී ලාල් ප්‍රියන්තගෙන් ප්‍රශ්න කළේය.[32] | අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, පුවත්පත් නිදහස / පොලිසිය විසින් ප්‍රශ්න කරනු ලැබීම. |

| සිදුවීම/ක්‍රියාව/දිස්ත්‍රික්කය | දිනය/මාසය | විස්තරය සහ අදහස් | වර්ගය සහ ස්වභාවය |
|---|---|---|---|
| පොලිසිය විසින් මාධ්‍යවේදියකුට අවහිර කොට හිරිහැර කරනු ලැබීම - මාතර | ජුලි 15 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ මාධ්‍යවේදී චමල් ප්‍රනාන්දු, මාතර අධිරණයෙන් පිටත වාර්තාකරණයේ යෙදී සිටිය දී පොලිසිය ඔහුට අවහිර කොට හිරිහැර කළේය.[33] | පටිගත කිරීමේ නිදහස / පොලිසියෙන් තර්ජන සහ හිරිහැර සිදු කිරීම |
| මාධ්‍යවේදියකුට තර්ජනය කිරීම - යාපනය | ජුලි 22 | කිලිනොච්චියේ නිදහස් මාධ්‍යවේදියකු වන සුබ්‍රමනියම් බාස්කරන්ට මරණීය තර්ජන එල්ල කළ දේශපාලන පක්ෂ සාමාජිකයින් දෙදෙනෙකු ඔහුගේ කැමැත්තකින් තොරව ඔහුගේ ඡායාරූප ගෙන ඇත. ඒ අවස්ථාවේ ඔහු කිලිනොච්චි මහේස්ත්‍රාත් උසාවියේ රාජකාරියේ යෙදී සිටියේය.[34] | අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, පුවත්පත් නිදහස /මාධ්‍යවේදියකුගේ ආරක්ෂාව, තර්ජනය කිරීම |
| මාධ්‍යවේදියකුට පහර දීම - යාපනය | අගෝස්තු 21 | වාලම්පුරි පුවත්පතෙහි සහ වෙබ් අඩවියෙහි දෙමළ මාධ්‍යවේදී විජයනාතන් ජනර්තන්ට යාපනයේ බ්‍රවුන්ස් වීදියේ දී, යතුරු පැදිවලින් පැමිණි වෙස් මුහුණු පැළඳි හඳුනා නොගත් දෙදෙනකු විසින් පහර දෙනු ලැබීය.[35] | අදහස් ප්‍රකාශකිරීමේ නිදහස, පුවත්පත් නිදහස / පහර දීම |
| මාධ්‍යවේදියකුට තර්ජනය කොට ඔහුගේ මවට පහර දී අඩන්තේට්ටම් කිරීම - ත්‍රිකුණාමලය | අගෝස්තු 31 | නිවාස ගණනාවකට ප්‍රවේශය ලබාදෙන පොදු මාර්ගයක් අවහිර වන අනවසර ඉදිකිරීමක් ගැන කළ පැමිණිල්ලක් මත මාධ්‍යවේදියකුට මරණීය තර්ජන එල්ල කොට ඔහුගේ මවට පහර දී අඩන්තේට්ටම් කොට ඇත.[36] | අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, පුවත්පත් නිදහස / මාධ්‍යවේදියකුගේ ආරක්ෂාව, මරණීය තර්ජන, පහර දී අඩන්තේට්ටම් කිරීම |
| වෙබ් මාධ්‍යවේදියකු අසාධාරණ ලෙස අත් අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම. | අගෝස්තු 31 | ලංකා නිව්ස් වෙබ් ඩොට් ඔර්ග් වෙබ් අඩවියෙහි කර්තෘ චෙස්මන්ඩ් චතුරංග ද සිල්වා අසාධාරණ ලෙස අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනිණි. අත්අඩංගුවට ගැනීම නීත්‍යානුකූල ආකාරයට සිදු කළද, වෙබ් කර්තෘවරයා අත් අඩංගුවට ගැනීමට විශාල කණ්ඩායමක් යෑමේ ක්‍රියාවලිය මාධ්‍යවේදීන් බියපත් කිරීමේ පියවරක් බව මාධ්‍ය සංවිධාන සඳහන් කරයි.[37] | අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස / බිය ගැන්වීම, අධි ප්‍රතිචාරය |
| මාධ්‍යවේදීන් දෙදෙනෙකුට පහර දීමට සහ අඩන්තේට්ටම් කිරීමට තැත් කිරීම - කොළඹ | සැප්තැම්බර් 07 | පාරිභෝගික අයිතීන් සුරකීමේ ජාතික ව්‍යාපාරය විසින් සංවිධානය කරනු ලැබූ ප්‍රවෘත්ති සාකච්ඡාවක දී තමන්ට පහර දී අඩන්තේට්ටම් කිරීමට තැත් කළ බවට මව්බිම පුවත්පතේ මාධ්‍යවේදීන් දෙදෙනකු වන නුවන් හෙට්ටිආරච්චි සහ රුවන්ත කිතුල්ගස්පේ බොරැල්ල පොලිසියට පැමිණිලි කළහ.[38] | පටිගත කිරීමේ නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස / මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව, පහර දී අඩන්තේට්ටම් කිරීමට තැත් කිරීම. |
| ආරාධනයකට අනුව පැමිණි මාධ්‍යවේදීන්ට රැස්වීමට සහභාගී වීමට ඉඩ නොදීම - කුරුණෑගල | සැප්තැම්බර් 14 | දිස්ත්‍රික් ලේකම්වරයා විසින් කලින් ආරාධනා යවා තිබුණ ද කුරුණෑගල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමට සහභාගීවීමට මාධ්‍යවේදීන්ට ඉඩ දෙනු නොලැබීය.[39] | තොරතුරු දැනගැනීමේ නිදහස / ප්‍රවේශයට ඉඩ නොදීම |
| කෝප් කමිටු රැස්වීම් මාධ්‍යයට තහනම් කිරීම - කොළඹ | සැප්තැම්බර් 23 | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (කෝප්) රැස්වීම් මින් ඉදිරියට මාධ්‍යයට විවෘත නොකරන බව ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිවරයා නිවේදනය කළේය.[40] | තොරතුරු දැනගැනීමේ අයිතිය / ප්‍රවේශය හෝ වාර්තා කිරීම හෝ තහනම් කිරීම |

| සිදුවීම/ක්‍රියාව/දිස්ත්‍රික්කය | දිනය/මාසය | විස්තරය සහ අදහස් | වර්ගය සහ ස්වභාවය |
|---|---|---|---|
| පොලිසිය විසින් මාධ්‍යවේදීන් බිය ගන්වනු ලැබීම - උතුරු පළාත | සැප්තැම්බර් | උතුරු ශ්‍රී ලංකාවේ පැවති අනුස්මරණ උත්සව අවස්ථාවක මහජන ප්‍රකාශ පටිගත කරමින් සිටියදී, සිවිල් ඇඳුමින් සැරසුණු පොලිස් බුද්ධි අංශ නිලධාරීහු මාධ්‍යවේදීන් බිය ගැන්වීමේ යෙදුණහ.[41] | පටිගත කිරීමේ නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස / පොලිසිය විසින් බිය ගන්වනු ලැබීම |
| මාධ්‍යවේදීන් හතර දෙනෙකුගේ වැඩ තහනම් කිරීම - කොළඹ | සැප්තැම්බර් | ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ නම සඳහන් කිරීමේ දී පරිගණක අකුරු කරණයේ වරදක් මත, රජයට අයත් මුද්‍රිත මාධ්‍ය ආයතනය වන ලේක් හවුස්හි මාධ්‍යවේදීන් හතර දෙනෙකුගේ වැඩ තහනම් කරනු ලැබීය.[42] | පුවත්පත් නිදහස / විනය පියවර ගැනීම |
| රූපවාහිනී මාධ්‍යවේදියකුට පහරදීම - මොණරාගල | ඔක්තෝබර් 03 | මොණරාගල දිස්ත්‍රික්කයේ කුඹුක්කන් ඔය ප්‍රදේශයේ නීති විරෝධී වැලි ගොඩ දැමීම ගැන වාර්තා කරමින් සිටියදී, දෙරණ රූපවාහිනියේ මාධ්‍යවේදී ඉඳුනිල් විජේනායක වැලි ව්‍යාපාරයේ නිරත වූවන්ගේ ප්‍රහාරයකට ලක් විය.[43] | පටිගත කිරීමේ නිදහස / මාධ්‍යවේදියාගේ ආරක්ෂාව, පහර දීම |
| මාධ්‍යවේදියා බලහත්කාරයෙන් ඉවත් කිරීම - පුත්තලම | ඔක්තෝබර් 08 | ප්‍රාදේශීය සභා සභාපතිවරයා විසින් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා රැස්වීමෙන් මාධ්‍යවේදී ප්‍රසාද් පූර්නමාල් බලහත්කාරයෙන් ඉවත් කරනු ලැබීය.[44] | තොරතුරු දැන ගැනීමේ නිදහස / ප්‍රවේශයට ඉඩ නොදීම, බලහත්කාරයෙන් ඉවත් කිරීම. |
| වාර්තාකරණයේ යෙදී සිටිය දී මාධ්‍යවේදියකුට පහර දී අඩන්තේට්ටම් කිරීම - ත්‍රිකුණාමලය | ඔක්තෝබර් 11 | ස්වාධීන රූපවාහිනී ජාලයේ (අයි ටී එන්) ප්‍රාදේශීය වාර්තාකරු එම්.එච්. යුසුෆ් ත්‍රිකුණාමලයේ හදිසි අනතුරක් වාර්තා කරමින් සිටිය දී ඔහුට පහර දී අඩන්තේට්ටම් කොට ඇති අතර එම අවස්ථාවේ දී ඔහුගේ කැමරාව ද නැති විය.[45] | පටිගත කිරීමේ නිදහස / මාධ්‍යවේදියාගේ ආරක්ෂාව, පහර දී අඩන්තේට්ටම් කිරීම සහ මාධ්‍ය උපකරණ පැහැර ගැනීම. |
| මාධ්‍යවේදීන් දෙදෙනෙකුට පහරදීම - මුලතිව් | ඔක්තෝබර් 12 | මුලතිව්හි මුරිප්පු වන රක්ෂිතයේ නීති විරෝධී දැව ජාවාරමක් විමර්ශනය කරමින් සිටිය දී , මුද්‍රිත, රූපවාහිනී සහ අන්තර්ජාල මාධ්‍ය ආයතන කිහිපයකට සේවය සපයන දෙමළ ප්‍රාදේශීය මාධ්‍යවේදීන් වන කනපතිපිල්ලේ කුමනන් සහ ෂන්මුගම් දේවශිලන් දෙදෙනාට තර්ජනය කොට පහර දී ඇත.[46] | පටිගත් කිරීමේ නිදහස / මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව, පහර දීම |
| මාධ්‍යවේදියකුට පහර දී අඩන්තේට්ටම් කිරීමට තැත් කිරීම සහ මරණීය තර්ජන කිරීම - රත්නපුර | ඔක්තෝබර් 12 | විදුලි බලාගාරයේ පාරිසරික හානිය පිළිබඳව ගවේෂණයක් කරමින් සිටිය දී කලවානේ හපුගොඩ ප්‍රදේශයේ දී විදුලි බලාගාරයක කාර්යමණ්ඩලය විසින් මාධ්‍යවේදියකුට පහර දී අඩන්තේට්ටම් කිරීමකට තැත් කොට මරණීය තර්ජන කිරීම[47] | පටිගත කිරීමේ නිදහස / මාධ්‍යවේදියාගේ ආරක්ෂාව, තර්ජනය කිරීම |
| පාස්කු ඉරිදා ප්‍රහාරය ගැන ජනාධිපති කොමිසන් සභාවේ කටයුතු වාර්තා කිරීමට ගිය මාධ්‍යවේදියකුට ප්‍රවේශයට ඉඩ නොදීම | ඔක්තෝබර් 23 | පාස්කු බෝම්බ ප්‍රහාර ගැන පරීක්ෂා කරන ජනාධිපති කොමිසන් සභාවේ කටයුතු වාර්තා කිරීමට ගිය මාධ්‍යවේදියකු, කොමිසම ස්ථාපිත කොට තිබූ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (බී.එම්.අයි.සී.එච්.) ප්‍රධාන විධායක නිලධාරියා විසින් ඉවත් කරනු ලැබීම[48] | තොරතුරු දැන ගැනීමේ නිදහස, පටිගත කිරීමේ නිදහස / ප්‍රවේශයට ඉඩ නොදීම. |

| සිදුවීම/ක්‍රියාව/දිස්ත්‍රික්කය | දිනය/මාසය | විස්තරය සහ අදහස් | වර්ගය සහ ස්වභාවය |
|---|---|---|---|
| මාධ්‍යවේදී එස් මුකුන්තන්ට පහර දීම - යාපනය | නොවැම්බර් 11 | යාපනයේ පදනම් මාධ්‍යවේදියකු වූ එස් මුකුන්තන්ට ඔහුගේ නිවසේ දී නොහඳුනන පිරිසක් පහර දී ඇත. පහරදුන් පිරිස ඔහුගේ දුරකථනය ද පැහැර ගෙන ගොස් ඇත.[49] | අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස / මාධ්‍යවේදියාගේ ආරක්ෂාව, පහර දීම. |
| මඩකලපුව පොලිසිය මාධ්‍යවේදියකුගෙන් ප්‍රශ්න කිරීම - මඩකලපුව | නොවැම්බර් 16 | මඩකලපුවේ මාධ්‍යවේදියකු මෙන්ම, මඩකලපුව පුවත්පත් සමාජයේ ලේකම් වරයා ද වූ සෙල්වකුමාර් නිලන්තන්ගෙන් ඔහුගේ නිවසේ දී පොලිස් නිලධාරීන් සතර දෙනෙකු විසින් ප්‍රශ්න කරන ලද්දේ ගොවි ප්‍රශ්නයක් පිළිබඳව ඔහුගේ වාර්තා කිරීම් සම්බන්ධයෙනි.[50] | අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, පුවත්පත් නිදහස / පොලිසිය විසින් ප්‍රශ්න කරනු ලැබීම |
| කොළඹ අපරාධ කොට්ඨාශය විසින් මාධ්‍යවේදියකු කැඳවීම. | නොවැම්බර් 17 | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දේශපාලනඥයකු සහ මාධ්‍ය ක්‍රියාකාරිකයකු වූ ධනුෂ්ක රාමනායක කැඳවා ඔහුගේ ෆේස්බුක් පිටුවේ පළ කොට තිබූ ඡායාරූපයක් ගැන ප්‍රශ්න කළේය.[51] | අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස / පොලිසිය විසින් ප්‍රශ්න කරනු ලැබීම. |
| මාධ්‍යවේදියකු අත් අඩංගුවට ගැනීම - මඩකලපුව | නොවැම්බර් 29 | මාධ්‍යවේදියකු සහ මඩකලපුව පුවත්පත් සමාජයේ සාමාජිකයකු වූ ගෝකුලදාසන් පොලිස් ත්‍රස්තවාදී විමර්ශන අංශය විසින් අත් අඩංගුවට ගත්තේ ඔහු සිය ෆේස්බුක් ගිණුමේ දෙමළ ඊලාම් විමුක්ති කොටි (එල්ටීටීඊ) ඡායාරූපයක් පළ කළ බවට චෝදනා කරමිනි.[52] | අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස / පොලිසිය විසින් අත් අඩංගුවට ගෙන රඳවා ගනු ලැබීම. |
| මාධ්‍යවේදියකුට පහර දී තර්ජනය කිරීම - කෑගල්ල | නොවැම්බර් 30 | මාවනැල්ල දෙවනගල දී සිවිල් පුද්ගලයින් විසින් මාධ්‍යවේදියකුට පහර දී තර්ජනය කිරීම[53] | අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස / මාධ්‍යවේදියාගේ ආරක්ෂාව, පහරදීම සහ තර්ජනය කිරීම. |
| 'සංදේශය' නවතා දැමීම | දෙසැම්බර් 01 | සිරස එෆ්.එම්. රේඩියෝ නාලිකාවේ, සතියට දින පහක් රාත්‍රී 10.00 ට විකාශය වූ බී බී සී සංදේශය මිනිත්තු පහක ගුවන්විදුලි වැඩ සටහන 2020 දෙසැම්බර් 01 දින සිට නවතා දමනු ලැබීය.[54] | විකාශනයේ නිදහස / ගුවන්විදුලි විකාශයක් නවතා දැමීම. |
| අන්තර්ජාල / සමාජ මාධ්‍ය පාලනය | දෙසැම්බර් | අන්තර්ජාල / සමාජ මාධ්‍ය පාලනය කිරීමට ආණ්ඩුව සැලසුම් කරන බව මාධ්‍ය ඇමති කෙහෙළිය රඹුක්වැල්ල මහතා අවස්ථා ගණනාවකදී ප්‍රකාශ කළේය.[55] | අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස / විනිවිදභාවයකින් තොරව අන්තර්ජාල / සමාජ මාධ්‍ය පාලනය කිරීම |
| පුවත්පතකට එරෙහිව පොලිසිය නඩුවක් ගොනු කිරීම | දෙසැම්බර් | එල්.ටී.ටී.ඊ. නායක වේලුපිල්ලේ ප්‍රභාකරන්ගේ උපන්දිනය වන නොවැම්බර් 26 දා, ඔහුගේ ඡායාරූපයක් සහ ප්‍රකාශ පළ කිරීම ගැන යාපනයේ පළ වන උදයන් පුවත්පතට එරෙහිව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පොලිසිය නඩුවක් ගොනු කළේය. | අදහස් පළ කිරීමේ නිදහස, පුවත්පත් නිදහස / පොලිසිය විසින් නඩුවක් ගොනු කරනු ලැබීම. |

## මූලාශ්‍ර


1 https://www.tamilguardian.com/content/sri-lankan-police-threaten-family-tamil-guardian-correspondent-arrest-warrant (Last accessed, 04/02/2021)

2 https://www.inform.lk/wp-content/uploads/2020/02/ROD-january-2020.pdf, page 07 (Last accessed, 04/02/2021)

3 https://samsn.ifj.org/the-free-media-movement-condemns-the-degrading-treatment-meted-out-for-professional-journalists/, https://samsn.ifj.org/sri-lanka-police-refuse-to-file-death-threat-complaint-by-journalist/ (Last accessed, 04/02/2021)

4 http://www.fmmsrilanka.lk/the-law-should-be-enforced-immediately-against-the-assault-of-journalist-free-media-movement/ (Last accessed ,04/02/2021)

5 https://www.inform.lk/wp-content/uploads/2020/02/ROD-january-2020.pdf, page 07 (Last accessed, 04/02/2021)

6 https://www.tamilguardian.com/content/tamil-journalists-home-wrecked-vandals-intimidation-attempt (Last accessed, 04/02/2021)

7 https://www.facebook.com/AzzamAmeenSL/photos/a.1549879965318657/2203342193305761/?type=3&theater (Last accessed, 04/02/2021)

8 https://samsn.ifj.org/sri-lanka-tamil-journalists-receive-death-threats/ (Last accessed, 04/02/2021)

9 https://www.colombotelegraph.com/index.php/gotas-goons-ramp-up-crackdown-on-disloyal-journalists-and-their-sources/ (Last accessed, 04/02/2021)

10 https://samsn.ifj.org/free-media-movement-condemns-the-obstruction-of-the-work-of-journalist/ (Last accessed, 04/02/2021)

11 http://www.themorning.lk/cid-records-statement-from-sunday-observer-journalist/ (Last accessed, 04/02/2021)

12 https://janayugaya.lk/2020/02/18/threats-from-buddhists/ (Last accessed, 04/02/2021)

13 Anidda, A weekly Sinhala language newspaper, 23rd of February 2020, Page 01

14 https://www.tamilguardian.com/content/vavuniya-newspaper-director-summoned-sri-lankas-tid-after-covering-un-human-rights-council (Last accessed, 04/02/2021)

15 https://www.newsfirst.lk/2020/03/17/investigations-underway-to-arrest-40-suspects-for-spreading-fake-news-on-social-media/ (Last accessed, 06/02/2021)

16 https://www.lankadeepa.lk/latest_news/මාධ්‍යවේදියෙකුට-මරණ-තර්ජන-එල්ල-කළ_පුද්ගලයෙකුඅත්අඩංගුවට/1-569044 (Last accessed, 05/02/2021)

17 http://www.lankadeepa.lk/latest_news/බොරුතොරතුරුදුන්වෛද්‍යවරයකුරිමාන්ඩ්/1-569292 (Last accessed, 05/02/2021)

18 https://www.tamilguardian.com/content/tamil-journalist-attacked-kilinochchi-despite-military-enforced-curfew%C2%A0, (Last accessed 05/02/2021)

19 https://srilankabrief.org/2020/04/sri-lanka-the-truth-about-the-arrest-and-detention-of-ramzy-razeek/ (Last accessed, 06/02/2021)

20 The researcher done a personal interviews with two of victims on 16th of January 2021

21 https://www.inform.lk/wp-content/uploads/2020/02/ROD-january-2020.pdf, page 21, (Last accessed, 05/02/2021), The researcher also done a personal interview with one of victims on 20th of January 2021

22 Anidda Newspaper, 10th of May 2020

23 http://www.dailynews.lk/2020/05/18/local/218851/probe-hacking-websites (Last accessed, 06/02/2021)

24 https://samsn.ifj.org/sri-lanka-obstructing-and-intimidating-the-work-of-regional-journalist-bimal-shyaman-is-a-violation-of-media-freedom-free-media-movement/, https://samsn.ifj.org/sri-lanka-regional-tv-correspondent-assaulted/ ( Last accessed, 04/02/2021)

25 http://www.newswire.lk/2020/06/15/cid-seizes-journalists-laptop/ (Last accessed, 06/ 02/2021)

26 https://theleader.lk/news/3178-commemoration-of-tamil-journalist-killed-most-of-them-are-intelligence-officers (Last accessed, 06/02/2021)

27 https://www.tamilguardian.com/content/sri-lanka-blocks-sankathi24-tamil-news-website-press-crackdown-continues (Last accessed, 06/02/2021)

28 http://www.newswire.lk/2020/06/15/cid-seizes-journalists-laptop/ (Last accessed, 06/02/2021)

29 https://divaina.com/daily/index.php/main-news/44911-2-13-24 (Last accessed, 06/02/2021)

30 https://www.tamilguardian.com/content/sri-lankan-police-summon-tamil-guardians-mullaitivu-correspondent (Last accessed, 06/02/2021)

31 https://samsn.ifj.org/sri-lanka-police-and-key-murder-suspect-obstruct-photojournalist-outside-court/ (Last accessed, 06/02/2021)

https://samsn.ifj.org/sri-lanka-we-strongly-condemn-inspector-neomal-rangajeewas-conduct-in-the-court-premises-free-media-movement/ (Last accessed, 06/02/2021)

32 https://www.colombotelegraph.com/index.php/journalist-interrogated-by-cid-about-2017-article-on-lasantha-wickrematunge-murder/ (Last accessed, 06/02/2021)

33 https://samsn.ifj.org/free-media-movement-the-harassment-of-the-journalist-in-matara-is-yet-another-classic-example-of-the-police-misconduct/ (Last accessed, 06/02/2020)

34 https://mawbima.lk/print-more/29939 (Last accessed, 06/02/2021)

35 https://www.tamilguardian.com/content/young-tamil-journalist-attacked-unidentified-men-jaffna (Last accessed, 06/02/2021)

36 https://mawbima.lk/backend/uploads/e_paper/MB-1-16-03-09-2020.pdf, Page 05 (Last accessed, 07/02/2021)

37 https://samsn.ifj.org/sri-lanka-media-associations-are-paying-attention-with-regard-to-the-arrest-of-web-editor-chathuranga-de-silva/, https://samsn.ifj.org/sri-lanka-the-arrest-of-lankanewsweb-org-editor-chathuranga-silva-lets-be-vigilant/ (Last accessed, 06/02/2021)

38 https://ceylontoday.lk/news/ngo-gang-berates-mawbima-journalists (Last accessed, 07/02/2021)

39 Lankadeepa newspaper, 15/09/2020

40 http://www.themorning.lk/cope-meetings-not-open-to-media-in-future/ (Last accessed, 07/02/2021)

41 http://www.jdslanka.org/index.php/news-features/media/966-police-obstruct-tamil-journalists-carrying-out-their-duty-in-northern-sri-lanka (Last accessed, 07/02/2021)

42 Personal interview by the researcher on 20/12/2020

43 https://samsn.ifj.org/sri-lanka-sand-mafia-attack-journalist/, https://samsn.ifj.org/sri-lanka-the-law-should-be-enforced-against-those-who-attacked-the-journalist-in-monaragala-regardless-of-their-status-free-media-movement/ (Last accessed, 07/02/2021)

44 https://mawbima.lk/news-more/71917 (Last accessed, 07/02/2021)

45 http://www.slmmf.org/2020/10/blog-post.html (Last accessed, 07/02/2020)

46 https://samsn.ifj.org/sri-lanka-the-attacks-on-mullaitivu-journalists-are-disgusting-free-media-movement/, https://samsn.ifj.org/sri-lanka-journalists-exposing-timber-smuggling-attacked/ (Last accessed, 07/02/2021)

47 https://mawbima.lk/print-more/34269 (Last accessed, 07/02/2021)

48 https://medialk.com/archives/981 (Last accessed, 07/02/2021)

49 https://www.tamilguardian.com/content/another-tamil-journalist-attacked-jaffna (Last accessed, 07/02/2021)

50 https://www.tamilguardian.com/content/sri-lankan-police-interrogate-tamil-journalist-reporting-sinhala-settlements-tamil-cattle (Last accessed, 07/02/2021)

51 http://www.newswire.lk/2020/11/17/jhu-local-councillor-danushka-ramanayake-summoned-by-cid/ (Last accessed, 07/02/2021)

52 https://www.tamilguardian.com/content/tamil-journalist-arrested-sri-lanka-s-terrorism-investigation-division (Last accessed, 07/02/2021)

53 https://ceylonnews24.com/news/6468/ (Last accessed, 07/02/2021)

54 https://www.fmmsrilanka.lk/shutting-down-the-sandeshaya-radio-broadcast-is-a-matter-of-great-concern/ (Last accessed, 07/02/2021)

55 https://economynext.com/new-spore-style-regulatory-framework-for-sri-lanka-websites-activists-concerned-76270/?utm_campaign=EconomyNext%20News&utm_medium=email&utm_source=Revue%20newsletter, https://www.newsfirst.lk/2020/12/20/sri-lanka-to-register-social-media-users-keheliya/ (Last accessed, 07/02/2021)

# 2020 Media Freedom in Sri Lanka Annual Report

Free Media Movement

FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

Sponsored by

OPEN SOCIETY FOUNDATIONS

ISBN 978-624-5909-00-1